# වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය
# ஆண்டறிக்கையும் கணக்குக் கூற்றும்
# ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS

## 2018

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය**
தேசிய வடிவமைப்பு நிலையம்
National Design Centre

# අන්තර්ගතය


| | |
|---|---|
| මග පෙන්වන මුලධර්ම | 01 |
| ▪ දැක්ම<br>▪ මෙහෙවර | |
| ආයතනික අරමුණු හා  හර වටිනාකම් | 03 |
| ආයතන පනත හා ලියාපදිංචිය | 04 |
| ආයතන කලමනාකාරිත්වය | 05 |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය | 06 |
| සභාපතිගේ පණිවුඩය | 07 |
| අධ්‍යක්ෂගේ පණිවුඩය | 08 |
| ආයතන ව්‍යුහය | 09 |
| මානව සම්පත | 10 |
| මූල්‍ය කාර්ය සාධනය | 11 |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 12 - 21 |
| සේවා සැපයීම් | 22 - 29 |
| 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අවසාන ගිණුම් | 31 - 61 |
| 2018 ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව | 62 - 68 |

## මග පෙන්වන මූලධර්ම

### දැක්ම

නිර්මාණ සංවර්ධනය හා
නව නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම තුලින්
හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය
වඩාත් සක්‍රිය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම

### මෙහෙවර

ප්‍රවර්ධනය, සංවර්ධනය,
හැකියාවන් ගොඩනැංවීම,
ප්‍රචලිත කිරීම සහ
ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුලින්
වෙළඳපොල පාදක කරගත්
නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම.

Blank Page

# ආයතනික අරමුණු

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශිය මෙන්ම අපනයන වෙළඳපලෙහි වර්තමාන සහ අනාගත වෙළඳපල නැම්යාවන්ට අනුව නව නිර්මාණ හඳුන්වා දීම.

- නිෂ්පාදන ධාරිතාව වැඩිකර ගැනීම සහ උසස් නිමාවකින් යුතු අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම අරමුණු කරගෙන නිසි තාක්ෂණික ක්‍රම හා අමුද්‍රව්‍ය පිළියෙල කරගැනීමේ ක්‍රම හඳුන්වා දීම.

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු පහසුකම් සැලසීම සඳහා පොදු පහසුකම් සේවාවන් ලබාදීම.

- හස්තකර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- ප්‍රකාශන, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුස්තකාල පහසුකම් සැපයීම මගින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට, අලෙවිකරුවන්ට සහ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ වී සිටින්නන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම සහ වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.

## හර වටිනාකම්

✓ අප වගකීමෙන් බැඳී සිටිමු

✓ අවංක හා විනිවිදභාවයෙන් යුතු වෙමු

✓ නිපුනත්වය හා එකමුතු ප්‍රයත්නයන් විශ්වාස කරමු

✓ නව තාක්ෂණය හා අභිරුචිය භාවිතා කිරීමට පෙළඹෙමු

✓ හොඳ පාරිභෝගික සේවාවක් ලබා දෙන බවට විශ්වාස කරමු

## ආයතන පනත හා ලියාපදිංචිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද ජාතික මෝස්තර මධ්‍යස්ථානය දේශිය හස්ත කර්මාන්තයේ උන්නතිය උදෙසා හස්තකර්මාන්ත ශිල්පීන් සම්ප්‍රදායෙන් ඔබ්බට ගෙන යමින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය මූලික කරගෙන පිහිටුවනු ලැබූ සේවා සපයන රාජ්‍ය ආයතනයක් වන අතර මේ වන විට කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

## සංවිධානය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානය,** සමස්ත හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය අරමුණු ඉටු කරගැනිමට නිරතුරුව ක්‍රියාත්මක වී සිටී. මෙහිදී මොරටුව, කටුබැද්ද, ද මැල් පාරේ අංක 10 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වයෙන් හා මධ්‍යම පළාත ආවරණය කරමින් මහනුවර, කලාපුරය, නත්තරම්පොත පිහිටුවා ඇති ශාඛා කාර්යාලයේ සහයෝගයෙන් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් හස්ත කර්මාන්ත ශිල්පියා නඟා සිටුවීමට කැපවී සිටී.

මීට අමතරව, ඩිප්ලෝමා පාඨමාලා හරහා නව නිර්මාණකරුවන් බිහි කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන ජාතික පිරිනිර්මාණ විද්‍යාලය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති අතර ඒ හරහා නිර්මාණශීලි හැකියාවන් ඇති තරුණ තරුණියන්ට ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර තලය දක්වා වෘත්තීය දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව ලබාදී ඇත.

එමෙන්ම, නත්තරම්පොත ශාඛා කාර්යාලය තුල ස්ථාපිත පිත්තල, ලාක්ෂා, හා සම් ආශ්‍රිත වැඩහල හා පොදු පහසුකම් මධ්‍යස්ථානය මගින් හස්තකර්මාන්ත ශිල්පියාට අඛණ්ඩ සේවාවක් සපයයි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සිය දැක්ම ප්‍රධාන කොට ක්‍රියාත්මක මෙහෙවර තුලින් තම අරමුණු ඉටු කිරීමේදි ප්‍රධාන කාර්යාලයේ මූලිකත්වය ඇතිව හා නත්තරම්පොත පිහිටි ශාඛා කාර්යාලයේ සහයෝගය ඇතිව ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීමත්, පවතින අනෙකුත් සහෝදර ආයතන මෙන්ම පළාත් සභා හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හි නියැලෙන ස්වෙච්ඡා සංවිධාන, හස්ත කර්මාන්තකරුවෝ සහ වෙනත් බාහිර ආයතන ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා නිරතුරුව සම්බන්ධ වේ.

සියළුම පරිපාලන, මූල්‍ය, අලෙවි ප්‍රවර්ධන කටයුතු, මෝස්තර සංවර්ධන, මෝස්තර අධ්‍යාපන, තාක්ෂණික සංවර්ධන මෙන්ම පර්යේෂණ හා සංවර්ධන යන ක්ෂේත්‍රයන්ට අදාල කාර්යයන් ද පොදු පහසුකම් හා පුස්තකාල සේවා සැපයීම ආදි ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකිරීමට අදාල සියළුම කාර්යයන් ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරන අතර පරිපාලන, මූල්‍ය සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු හැර අනෙකුත් සියළු කටයුතු නත්තරම්පොත ව්‍යාපෘති කාර්යාලය මගින් ද ඉටු කෙරේ.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලය | - | අංක 10, ද මෙල් පාර, කටුබැද්ද, මොරටුව. |
| | දුරකථන/ෆැක්ස් අංක | - | 011-2607114 - සභාපති |
| | | | 011-2626345 - අධ්‍යක්ෂ |
| | | | 011-2607814 - පොදු |
| | ෆැක්ස් | - | 011-2607111 |
| | ඊ-මේල් | - | info@slndc.gov.lk |

(ii) නත්තරම්පොත ව්‍යාපෘතිය - කලාපුරය, නත්තරම්පොත.

කාර්යාලය සහ වැඩහල දුරකථන අංකය / ෆැක්ස් - 081-2420038

# අධ්‍යක්ෂ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | ඒ. එල්. එම්. මිල්හාන් මයා | - | සභාපති |
| 2. | එම්. එම්. අබ්දුල් කාදර් මයා | - | සාමාජික |
| 3. | ඉන්දිරා මල්වත්ත මිය | - | සාමාජික |
| 4. | ආචාර්ය එස්. එම්. එම්. ඉස්මයිල් | - | සාමාජික (2018 ජුනි මස දක්වා) |
| 5. | හේෂානි බෝගොල්ලාගම මෙය | - | සාමාජික |
| 6. | ඩබ්.කේ. ඩී. ඩන්ස්ටන් මිය | - | සාමාජික/භාණ්ඩාගාර නියෝජිත (2018.08.30 දක්වා) |
| 7. | එම්. ඒ. සී. එන්. සෙනවිරත්න මිය | - | සාමාජික 2018.08.31 සිට |
| 8. | පී. පී. රත්නායක මයා | - | උපදේශක |
| 9. | අයි. එස්. පට්ටියගමගේ මිය | - | අමාත්‍යාංශ නියෝජිත 2018.03.08 සිට |

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | | |
|---|---|---|
| මිල්හාන් ලතීෆ් මයා | - | සභාපති |
| එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි මයා | - | අධ්‍යක්ෂ |
| සෝමලතා ගම්ලත් මිය | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) බස්නාහිර පළාත / අංශ ප්‍රධානි |
| පී. කේ. විජේසිංහ මයා | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) මධ්‍යම පළාත |
| බී. මනතුංග මයා | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) උතුරු මැද සහ වයඹ පළාත |
| තමරා දමයන්ති මිය | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) ඌව සහ සබරගමු පළාත |
| ඩබ්. එම්. පියරත්න මයා | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) දකුණු පළාත |
| විජිත බණ්ඩාර මයා - | - | සහකාර අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) උතුර සහ නැගෙනහිර පළාත |
| බී. ආර්. රණවීර මිය | - | ගණකාධිකාරි |
| කේ. ප්‍රශාන්ත කීර්තිචන්ද්‍ර මයා | - | ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි |
| එන්. පී. කේ. ඉන්දික මයා | - | සහකාර අධ්‍යක්ෂ (අලෙවි) |
| පී. කේ. එන්. අසංගිකා මිය | - | සහකාර අධ්‍යක්ෂ (පාලන) |
| බී. ඒ. එන්. එන්. බමුණුසිංහ මිය | - | සහකාර අධ්‍යක්ෂ (රසායනික) |
| එස්. කේ. ආර්. එස්. කුමාර මයා | - | සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) කොන්ත්‍රාත් |

| බැංකුකරුවෝ | විගණනය |
|---|---|
| ලංකා බැංකුව, කටුබැද්ද | රජයේ විගණකාධිපති |
| මහජන බැංකුව, කටුබැද්ද | විගණකාධිපති දෙපාර්තමේන්තුව |

# සභාපතිගේ පණිවිඩය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව හා අනුබද්ධ ආයතන පනතින් ස්ථාපිත 1983 සිට ක්‍රියාත්මක වන ජාතික මෝස්තර මධ්‍යස්ථානය සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවා බිම් මට්ටමේ සිට ජාත්‍යන්තරය දක්වා ඔසවා තැබීමට මාහැඟි සේවාවක් කල හැකි ජාතික ආයතනයකි.

දැක්ම හා මෙහෙවර අනුව යමින් 2018 වසරේදී ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද සේවාව ප්‍රශංසනීය වේ.

මෙම 2018 වසර ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ වසර 35 ක පැවැත්ම සංකේතවත් කරන අතර, සේවා සපයන ආයතනයක් වන මෙම ආයතනය ක්‍රියාත්මක වන්නේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන අරමුදල් වලිනි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය අනෙකුත් සේවා අතර උපදේශන සේවා පැවැත්වීම, අධ්‍යයන පුහුණු වැඩසටහන් පැවැත්වීම හා පාඨමාලා පැවැත්වීම හරහා මධ්‍යස්ථානය උපයාගත් සංචිත ආදායම පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය වී ඇති බව කැපී පෙනෙන කරුණකි.

සමාලෝචිත වර්ෂයේදී ආයතනික ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය හා මගපෙන්වීමත්, කළමණාකරනය, කාර්ය මණ්ඩලය ඇතුලු සියලුම පාර්ශවකරුවන් විසින් ලබාදුන් සහයෝගය සහ කැපවීමත් මම කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමාගේ නිසි මග පෙන්වීම ඔස්සේ අද වන විට ග්‍රාමීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය මහත් පිබිදීමකට ලක්ව ඇති බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

ග්‍රාමීය ආර්ථිකය ඔසවා තැබීමට ඵලදායි ලෙස දායකත්වය ලබාදෙනු පිණිස මෙම මාහැඟි කර්තව්‍යයට උරදෙමින් සිටින ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

**මිල්හාන් ලතිෆ්**
**සභාපති,**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය.**

# අධ්‍යක්ෂගේ පණිවිඩය

2018 වර්ෂයේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව මා ඉමහත් සතුටට පත්වෙමි. අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව සලකා බැලීමේදී මූල්‍ය සහ භෞතික ප්‍රගතියේ කැපී පෙනෙන වර්ධනයක් මෙම වර්ෂය තුල දැකගත හැකිය. ආයතනයේ මූලික අරමුණු වලට අනුකූලව සහ ජාතික සංවර්ධන සැලසුම් වලට සමගාමීව විවිධ සංවර්ධන වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට මෙම වර්ෂය තුලදී හැකියාව ලැබී ඇත.


රට තුල සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම තුල ඇතිවී තිබෙන හිතකර වාතාවරණය ආර්ථික වර්ධනය උදාකර ගැනීම සඳහා මහත් පිටුවහලක් වී තිබෙන බව පැහැදිලි කරුණකි. නිවැරදිව සකස්කර ඇති පිස්කල් හා මූල්‍ය ප්‍රතිපත්ති මෙරට ආර්ථිකය අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා අවශ්‍ය උත්තේජන සපයා දෙන අතර මෙම තත්ත්වය තුල දේශීය සුලු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කල යුතුවේ.

හස්ත කර්මාන්තකරුවා නංවාලීම හා ඒ තුල ගැමි ආර්ථිකය ඔසවා තැබීම උදෙසා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරන ජාතික මෝස්තර මධ්‍යස්ථානය ග්‍රාමීය හස්ත කර්මාන්තකරුවා සංවර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටී. ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන යුගයට නිමැවුම් හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය 2018 වර්ෂයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) ඉතා සාර්ථකව පවත්වන ලදී.

දේශීය අමුද්‍රව්‍ය වලට වටිනාකමක් දෙමින් ක්‍රියාත්මක වන ග්‍රාමීය හස්ත කර්මාන්තය ඔප් නැංවීම උදෙසා ජාතික මෝස්තර මධ්‍යස්ථානයට අවශ්‍ය මග පෙන්වීම සහ නායකත්වය ලබාදීම වෙනුවෙන් අමාත්‍යාංශයේ ලේකම් රංජිත් අසෝක මහතා ඇතුළු අමාත්‍යාංශයේ සමස්ත කාර්යය මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පළ කරමි.

**එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි,**
**අධ්‍යක්ෂ,**
**ජාතික මෝස්තර මධ්‍යස්ථානය.**

# ආයතන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ
HM 1-3
ස.අ/නි.අ (මෝස්තර සංවර්ධන) (අංශ ප්‍රධානි/පළාත්)
ස.අ/නි.අ. (අලෙවි)
ස.අ/නි.අ. (රසායනික)
ස.අ/නි.අ. (නත්තරම්පොත)
ස.අ/නි.අ. (යාන්ත්‍රික)
ස.අ/නි.අ. (පාලන)
ගණකාධිකාරී
MM 1-1
ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක
මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරි
ගිණුම් නිලධාරි
JM 1-1
මෝස්තර සම්පාදක
වැඩසටහන් සම්බන්ධීකාරක
මෝස්තර සම්පාදක
MA 5-1
සංවර්ධන සහකාර
අලෙවි සහකාර
සංවර්ධන සහකාර
පුස්තකාල හා තොරතුරු සහකාර
සංවර්ධන සහකාර
MA 3
පෞද්ගලික සහකාර.
පෞද්ගලික සහකාර.
MA 2-1
ශිල්ප උපදේශක
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
ශිල්ප උපදේශක
කළමනාකර ණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
MA 1-1
රියැදුරු
රියැදුරු
PL 3
කාර්යාල සහායක / මුරකරු
කාර්යාල සහායක / මුරකරු
PL 1

# මානව සම්පත

| තනතුරු නාමය | සේවා ගණය | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | HM 1-3 | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෝස්තර සංවර්ධන) | MM 1-1 | 06 | 06 | - |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | MM 1-1 | 01 | 01 | |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (යාන්ත්‍රික) | MM 1-1 | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) | MM 1-1 | 01 | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ( රසායනික) | MM 1-1 | 01 | 01 | - |
| ගණකාධිකාරි | MM 1-1 | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ ගිණුම් නිලධාරි | MM 1-1 | 01 | 01 | - |
| පරිපාලන නිළධාරි | JM 1-1 | 01 | 01 | - |
| ගිණුම් නිළධාරි | JM 1-1 | 02 | 02 | - |
| විගණන නිළධාරි | JM 1-1 | 01 | - | - |
| ජ්‍යෙෂ්ඨ මෝස්තර සම්පාදක | JM 1-1 | 04 | 01 | 03 |
| මෝස්තර පුහුණු සම්බන්ධීකරණ නිලධාරි | JM 1-1 | 01 | 01 | |
| මෝස්තර සම්පාදක | MA 5-1 | 09 | 06 | 03 |
| වැඩසටහන් සම්බන්ධීකාරක | MA 5-1 | 01 | 01 | |
| අලෙවි සහකාර | MA 3 | 01 | - | 01 |
| පුස්තකාල හා තොරතුරු සහකාර | MA 3 | 01 | 01 | - |
| සංවර්ධන සහකාර | MA 3 | 03 | 01 | 02 |
| පෞද්ගලික සහකාර | MA 2-1 | 02 | 01 | 01 |
| කළමණාකරණ සහකාර | MA 1-1 | 13 | 11 | 02 |
| ශිල්ප උපදේශක | MA 1-1 | 32 | 21 | 11 |
| රියැදුරු | PL 3 | 06 | 04<br>02 contract | - |
| කාර්යාල සහායක | PL 1-1 | 17 | 14 | 03 |
| මුරකරු | PL 1-1 | 04 | 06 | - |
| පුහුණු සහායක | PL - 1 | 01 | 01 | - |

ජාතික මෝස්තර මධ්‍යස්ථානය මූලික වශයෙන් සේවා සපයන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මූල්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය මගින් සපයනු ලැබේ.


2018 අයවැය ඇස්තමේන්තු අනුව පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදි.


භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව ආයතනය විසින් ඉටුකරනු ලබන උපදේශක සේවා සඳහාත් රාජ්‍ය නොවන සංවිධාන අනුග්‍රහයෙන් කරනු ලබන නව මෝස්තර සංවර්ධන පුහුණු වැඩසටහන් සඳහාත් කරනු ලබන අය කිරීම් මෝස්තර උපදේශක සේවා ගිණුමටත් ,

පිරිනිර්මාණ ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා සිසුන්ගෙන් අය කරනු ලබන ගාස්තු මෝස්තර අධ්‍යාපන හා පුහුණු ගිණුමටත් ලැබේ.

කාර්ය මණ්ඩල ණය පහසුකම් සැපයීම් සඳහා චක්‍රීය අරමුදලක් සේ මෝස්තර සේවක ණය ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

## 2018




1. ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම (NDC)
2. සේවක ණය ගිණුම (SLF)
3. මෝස්තර උපදේශක සේවා ගිණුම (DCF)
4. මෝස්තර අධ්‍යාපන හා පුහුණු ගිණුම (DET)

# සංවර්ධන ක්‍රියාකාරකම්-2018

## නව නිර්මාණ සැලසුම් කිරීම සහ සංවර්ධන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය, තම අරමුණු කෙරෙහි අවධානය යොමු කරමින්, හස්තකර්මාන්ත කෙෂ්ත්‍රය සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීමත්, ඒවා හස්තකර්මාන්ත ශිල්පීන්ට විවිධ වැඩසටහන් ඔස්සේ හඳුන්වාදීමටත් ප්‍රමුඛව කටයුතු කරන අතර, එහි අතරමැදි කාර්යයක් වන සැලසුම් කළ නිර්මාණ අතුරින් තෝරාගත් නිර්මාණ සැලසුම් ජා.මෝ.ම. වැඩහල් තුල මූලික සාම්පල බවට පත් කිරීමට කටයුතු කෙරේ. ඊට අමතරව, සැලසුම් කළ නිර්මාණ අතුරින් කොටසක් හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ඉල්ලීම මත ඔවුන්ට හඳුන්වාදීමට මෝස්තර හා සංවර්ධන අංශය අඛණ්ඩව කටයුතු කර ඇත.

මෙම වර්ෂය තුල නව නිර්මාණ 680ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, ප්‍රධාන කාර්‍යාලයේ මෝස්තර අංශයෙන් හා නත්තරම්පොත ශාඛා කාර්යාලයෙන් නව නිර්මාණ සැලසුම් 835ක් සපුරා ගෙන ඇත. ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පත් කිරීම සඳහා එයින් නව නිර්මාණ 579ක් හඳුන්වාදී ඇත. ඊට අමතරව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන යටතේ, නව නිර්මාණ ප්‍රදර්ශනය වෙනුවෙන් , පිටත ශිල්පීන්ගේ

අවශ්‍යතාවය හා ඉල්ලීම මත නව නිර්මාණ 256 ක් සැලසුම් කර සෘජුව පිටත ශිල්පීන්ට හඳුන්වා දීමට කටයුතු කරන ලදි.

පහත ආකාරයට එක් එක් හස්තකර්මාන්ත කෙෂ්ත්‍ර සඳහා ජා.මෝ.ම. වැඩහල වෙත නව නිර්මාණ සැලසුම් ලබා දීමට මෝස්තර අංශය විසින් කටයුතු කර ඇත.

| හස්තකර්මාන්ත අංශය | ජා.මෝ.ම. වැඩහල සඳහා | |
|---|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | | |
| පන් හා කෙඳි අංශය | 52 | |
| දැව අංශය | 76 | |
| රෙදිපිළි අංශය | 61 | |
| ලණු හා වේවැල් අංශය | 70 | |
| රතු මැටි අංශය | 51 | |
| කොහු අංශය | 60 | |
| ආභරණ අංශය | 58 | 835 |
| **නත්තරම්පොත කාර්යාලය** | | |
| සම් අංශය | 39 | |
| පිත්තල අංශය | 61 | |
| ලාක්ෂා අංශය | 51 | |
| | 579 | |
| **පිටත ශිල්පීන්ගේ අවශ්‍යතාවය හා ඉල්ලීම මත සැලසුම් කළ නව නිර්මාණ** | 256 | |

එමෙන්ම, උපදේශන සේවා යටතේ හා පිටත ආයතන වල ඉල්ලීම මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 50ක් සැලසුම් කිරීමට ඉලක්ක කර තිබූ අතර, ජෛවිය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට

හා අනෙකුත් ආයතන වලින් ලද ඉල්ලීම් මත ග්‍රැෆික් හා ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ 87ක් නිර්මාණ සැලසුම් කිරීමට මෝස්තර හා සංවර්ධන අංශය කටයුතු කර ඇත.

## නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්තනය කිරීම.


සැලසුම් කළ නව නිර්මාණ සටහන් අතුරින් තෝරාගත් නිර්මාණ, මොරටුව සහ නත්තරම්පොත කාර්යාල පරිශ්‍රය තුල පිහිටි වැඩහල් හරහා මූලාදර්ශ බවට පත් කෙරේ. මෙහිදී සම්, පිත්තල හා ලාක්ෂා යන අංශ සඳහා සැලසුම් කරන ලද නව නිර්මාණ, නත්තරම්පොත වැඩහල තුලින් මූලාදර්ශ බවට පත් කෙරෙන අතර, පන් හා කෙඳි, රතු මැටි, කොහු, උණ හා වේවැල්, රෙදිපිළි, දැව සහ ආභරණ යන ක්ෂේත්‍ර මූලික කොට කරන ලද නිර්මාණ මොරටුව වැඩහල තුල මූලාදර්ශ බවට පත් කෙරේ.

මෙසේ සකස් කරන ලද මූලාදර්ශ, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් දිවයින පුරා විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර යටතේ සංවිධානය කරන නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන්, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත ඉල්ලීම් කරන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හරහා සිදුකරන වැඩසටහන් හා ජාතික මෝස්තර මධ්‍යස්ථානයට සේවා ලබාගැනීම සඳහා පැමිණෙන ශිල්පීන් මඟින්, පළාත් සභා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ශිල්ප සභාව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා සිදුකරන වැඩසටහන්, නව නිර්මාණ ප්‍රදර්ශන, අලෙවි සල්පිල් මගින් සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය හරහා වෙළඳපලට හඳුන්වාදීමට කටයුතු කෙරේ. .

ජා.මෝ.ම. වැඩහල් තුල නව නිර්මාණ මූලාදර්ශ බවට පරිවර්තනය කිරීම යටතේ 2018 වර්ෂයේ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ නව නිර්මාණ මූලාදර්ශ 420ක් සකස් කිරීමට ඉලක්ක කල අතර, නව නිර්මාණ මූලාදර්ශ 507ක් වසර තුල සපුරා ගැනීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කර ඇත.

එක් එක් ක්ෂේත්‍ර සඳහා ජා.මෝ.ම. වැඩහල වෙත හඳුන්වාදුන් නව නිර්මාණ පහත ආකාරයට මූලික සාම්පල බවට පත් කිරීමට කටයුතු කරන ලදි.

| හස්තකර්මාන්ත අංශය | මූලික සාම්පල සංඛ්‍යාව |
|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | |
| පන් හා කෙඳි අංශය | 29 |
| දැව අංශය | 66 |
| රෙදිපිළි අංශය | 42 |
| උණ හා වේවැල් අංශය | 47 |
| රතු මැටි අංශය | 43 |
| කොහු අංශය | 62 |
| ආභරණ අංශය | 38 |
| **නත්තරම්පොත කාර්යාලය** | |
| සම් භාණ්ඩ අංශය | 34 |
| පිත්තල අංශය | 87 |
| ලාක්ෂා අංශය | 59 |




මෙහිදී, මොරටුව ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 327ක් මූලාදර්ශ බවට පත් කර ඇති අතර, නත්තරම්පොත ජා.මෝ.ම. වැඩහල තුල නව නිර්මාණ 180ක් මූලාදර්ශ බවට පත් කිරීමට කටයුතු කර ඇත.

## හස්තකර්මාන්ත නව නිර්මාණ තුලින් සමරූ නිර්මාණ එළිදැක්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය නව නිර්මාණ හරහා දේශීය හස්තකර්මාන්ත, දේශීය මෙන්ම විදේශීය වෙළඳපල තුල ප්‍රචලිත කිරීමට කටයුතු කරයි. ඒ අතරින් දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් දේශීය අනන්‍යතාවය රැකෙන පරිදි සමරූ නිර්මාණ සංවර්ධනය කිරීම කෙරෙහි ද ජාතික මෝස්තර මධ්‍යස්ථානය අවධානය යොමු කරයි.

## නව නිර්මාණ සංවර්ධන ප්‍රායෝගික පුහුණු වැඩසටහන්

- **ක්‍රියාකාරී සැලැස්ම යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සංවිධානය කර පවත්වන ලද වැඩසටහන්**

  මෙම වර්ෂය සඳහා අනුමත ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා රු.මි. 2.500 ක් නව නිර්මාණ සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද අතර, එම ප්‍රතිපාදන යොදා ගනිමින් හා ඊට අමතරව පිටත ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යොදා ගනිමින් දැනුවත් කිරීම්, මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන්, උපදේශාත්මක වැඩසටහන් ඇතුළුව නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 30ක් පැවැත්වීමට හා ප්‍රතිලාභීන් 600 දෙනෙකුට ඒ හරහා පුහුණුව ලබාදීමට ඉලක්ක කරන ලදි.

  ඒ අනුව නව නිර්මාණ හඳුන්වාදීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 34ක් දිවයින පුරා තෝරාගත් ප්‍රදේශ තුල සිදු කරමින් ප්‍රතිලාභීන් 823 දෙනෙකුට නව නිර්මාණ, නව තාක්ෂණික දැනුම ලබා දෙමින් වෙළඳපලට ගැලපෙන නව නිර්මාන හඳුන්වා දෙන ලදි.

# ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් සිදුකරන ලද නව නිර්මාණ සංවර්ධන වැඩසටහන්

| | වැඩසටහනේ ස්භාවය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන | දිස්ත්‍රික්කය, ප්‍රා.ලේ.කො. හා පැවැත්වූ ස්ථානය | ශිල්පීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | දැනුවත් කිරීමේ වැඩසටහන | පන් හා කෙඳි | ජනවාරි-19<br>දින 01 | ගම්පහ-දුරළුව | 29 |
| | නව තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන-අදියර 02 | පන් හා කෙඳි | පෙබරවාරි-16<br>දින 03 | ගම්පහ-දුරළුව | 25 |
| | නව තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන-අදියර 03 | පන් හා කෙඳි | මාර්තු 24<br>දින 02 | ගම්පහ-දුරළුව | 25 |
| 02 | දැනුවත් කිරීමේ වැඩසටහන | උණ ලී | ජනවාරි-26<br>දින 01 | කෑගල්ල- යටියන්තොට | 15 |
| | දැනුවත් කිරීමේ හා උපකරණ බෙදදීමේ වැඩසටහන | උණ ලී | මැයි 03<br>දින 01 | කෑගල්ල- යටියන්තොට | 42 |
| | නව තාක්ෂණික පුහුණු වැඩසටහන-අදියර 02 | උණ ලී | අගෝස්තු 06 දින 02 | කෑගල්ල- යටියන්තොට | 15 |
| 03 | නව තාක්ෂණ හා උසස් පුහුණු වැඩසටහන-අදියර 01 | අත් යන්ත්‍ර රෙදි | පෙබරවාරි-26<br>දින 03 | මහනුවර-නත්තරම්පොත | 32 |
| 04 | නව තාක්ෂණ පුහුණු වැඩසටහන- | ස්ක්‍රීන් මුද්‍රණ | පෙබරවාරි-14<br>දින 03 | මහනුවර-නත්තරම්පොත | 25 |
| 05 | දැනුවත් කිරීමේ වැඩසටහන | කොහු | පෙබරවාරි-02<br>දින 01 | කුරුණෑගල- ගනේවත්ත | 29 |
| | නව තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන- | කොහු | මාර්තු 12<br>දින 05 | කුරුණෑගල- ගනේවත්ත | 18 |
| 06 | නව නිර්මාණ හා දැනුවත් කිරීමේ වැඩසටහන | උණ ලී | මාර්තු 06<br>දින 01 | ගාල්ල<br>බද්දේගම-ගිණිමැල්ලගහ | 24 |
| | නව නිර්මාණ හා තාක්ෂණික පුහුණු වැඩසටහන- දෙවන අදියර | උණ ලී | ජූනි 10<br>දින 03 | ගාල්ල<br>බද්දේගම-ගිණිමැල්ලගහ | 20 |
| 07 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | මාර්තු 17<br>දින 04 | මොරටුව- කල්දෙමුල්ල | 30 |
| 08 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රෙදිපිලි ආශ්‍රිත | අප්‍රේල් 03<br>දින 3 | කෑගල්ල- වරකාපොල | 30 |
| 09 | නව නිර්මාණ හා තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | උණ ලී | මැයි 30-01 ජූනි | මහනුවර- කුණ්ඩසාලේ | 17 |
| 10 | නව නිර්මාණ හා තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | අත්යන්ත්‍ර බෑග් | ජූනි 05<br>දින 03 | මහනුවර- කුණ්ඩසාලේ | 27 |
| 11 | නව නිර්මාණ හා තාක්ෂණික උසස් පුහුණු වැඩසටහන | කෙසෙල් පට්ට | ජූනි 18<br>දින 05 | කෑගල්ල - රඹුක්කන - අශෝකගම | 24 |
| 12 | නව නිර්මාණ පුහුණු වැඩසටහන - මූලික | දැව | ජූලි 03<br>දින 05 | පුත්තලම- හලාවත | 22 |
| 13 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | පිත්තල | ජූලි 24<br>දින04 | මහනුවර-පිලිමතලාව | 27 |
| 14 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | රතුමැටි | අගෝස්තු | උදුරගම | 30 |

| | වැඩසටහනේ ස්භාවය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන | දිස්ත්‍රික්කය, ප්‍රා.ලේ.කො. හා පැවැත්වූ ස්ථානය | ශිල්පීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 15 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | ස්ක්‍රීන් ප්‍රින්ටින් | අගෝස්තු | | 33 |
| 16 | නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | හණ | සැප්.07 දින4 | නුවරඑළිය-හඟුරන්කෙත | 41 |
| 17 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | සැහැල්ලු සෙල්ලම් භාණ්ඩ | සැප්. | | 26 |
| 18 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | උණ හා වේවැල් | සැප්. 10 දින 03 | ගම්පහ මීගමුව-තලාහේන | 15 |
| 19 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | තිර රෙදි | සැප්. 22 දින 03 | මොරටුව- කල්දෙමුල්ල | 19 |
| 20 | නව නිර්මාණ මූලික පුහුණු වැඩසටහන | රතුමැටි | ඔක්.09 දින 03 | අනුරාධපුර- මිහින්තලේ ඇලපුපන්කුලම | 35 |
| | නව නිර්මාණ උසස් පුහුණු වැඩසටහන | | දෙසැ.4 දින 02 | | 41 |
| 21 | දැනුවත් කිරීමේ වැඩසටහන | පොල්කටු | ඔක්.11 දින 01 | අනුරාධපුරය | |
| | නව නිර්මාණ පුහුණු වැඩසටහන | | ඔක්.19 දින 05 | | 29 |
| 22 | නව නිර්මාණ හා නව තාක්‍ෂණික පුහුණු වැඩසටහන | පාවහන් | ඔක්.29 දින 04 | මහනුවර | 25 |
| 23 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | පොල්කටු | නොවැ.14 දින 03 | මොරටුව | 13 |
| 24 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | වියලි බඩඉරිඟු | දෙසැ. දින 03 | මහනුවර- ගලගෙදර | 15 |

- **රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ නව නිර්මාණ පුහුණු වැඩසටහන් පැවැත්වීම**

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් හා ප්‍රතිපාදන යටතේ හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට හා ක්ෂේත්‍රයට නවක තරුණ කණ්ඩායම් සඳහා වෙළඳපලට ගැලපෙන නව නිර්මාණ හඳුන්වාදීම හා නව තාක්‍ෂණික දැනුම ලබාදීම සඳහා මූලික පුහුණු වැඩසටහන්, උසස් පුහුණු වැඩසටහන් පහත ආකාරයට සිදු කර ප්‍රතිලාභීන් 222 දෙනෙකුට අවශ්‍ය දැනුම ලබාදෙන ලදි.

| | වැඩසටහනේ ස්භාවය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | ආරම්භක දිනය හා පැවැත්වූ දින ගණන | දිස්ත්‍රික්කය | ශිල්පීන් සංඛ්‍යාව | මූල්‍ය දායකත්වය දැරූ ආයතනය | හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | නව නිර්මාණ හා නව තාක්‍ෂණික මූලික පුහුණු වැඩසටහන | දැව | ජනවාරි-24 දින 03 | කුරුණෑගල | 12 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය | |
| 02 | නව තාක්‍ෂණික උසස් පුහුණු වැඩසටහන- | තල්කොළ | මාර්තු 01 දින 04 | වවුනියාව | 30 | යූ.එන්.ඩී.පී. | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | අදියර 03 | | | | | | |
| 03 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | රතුමැටි | අප්‍රේල් 21 දින01 | කොළඹ - දොම්පේ- කළුකොඳයාව | 10 | ප්‍රා.ලේ.කා. - දොම්පේ | 10 |
| 04 | නව නිර්මාණ හා තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | අත්‍යන්ත්‍ර බෑග් | ජූනි 11 දින 03 | මහනුවර- කුණ්ඩසාලේ | 29 | රෙඩා. | |
| 05 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ෆයිබර් ග්ලාස් | ජූනි 04 දින 02 | මාතලේ පල්ලෙපොල | 30 | ප්‍රා.ලේ.කා. - පල්ලෙපොල | |
| 06 | නව නිර්මාණ පුහුණු වැඩසටහන | කොහු | ජූලි 29 | ගාල්ල- දොඩන්දුව | 10 | පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව | 06 |
| 07 | නව නිර්මාණ හා තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | අත්‍යන්ත්‍ර බෑග් | ජූලි 17 දින 03 | රත්නපුර- ලක්ෂපාන- පොල්පිටිය | 25 | රෙඩා. | 06 |
| 08 | නව තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | ෆයිබර් හා රබර් අච්චු | ජූලි 10 දින 03 | මහනුවර- කුණ්ඩසාලේ- දිගන | 20 | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, මහවැලි අධිකාරිය | 10 |
| 09 | නව තාක්ෂණික පුහුණු වැඩසටහන | ස්ක්‍රීන් ප්‍රින්ටින් | සැප්. | මාතලේ | 33 | මහා බැංකුව | |
| 10 | නව නිර්මාණ හා තාක්ෂණික මූලික පුහුණු වැඩසටහන | අත්‍යන්ත්‍ර රෙදි- බෑග් | ඔක්.10 | මාතලේ | 25 | කලාපීය ව්‍යවසායකත්ව ආයතනය | 6 |

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලද හා දායකත්වය දක්වන ලද ව්‍යාපෘති

### ව්‍යවසායකත්ව ගම්මාන හා කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන -2018

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ජාතික ශිල්ප සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන උක්ත ව්‍යාපෘතියෙන් නව නිර්මාණ සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් 2018 වර්ෂයේදී සිදුකරන ලදි.

ඒ අනුව, ජාතික ශිල්ප සභාව මඟින් තෝරාගත් හස්තකර්මාන්ත ගම්මාන 06ක් සඳහා නව නිර්මාණ සංවර්ධන හා තාක්ෂණය හදුන්වාදීමේ පුහුණු වැඩසටහන් ජාතික මෝස්තර මධ්‍යස්ථානය හරහා සිදු කරන ලද අතර, ඒ සඳහා එක් ගම්මානයකට රුපියල් මිලියන 0.3 බැගින් ගම්මාන 06 සඳහා රුපියල් මිලියන 1.8ක මුදල් ප්‍රතිපාදන ජාතික ශිල්ප සභාව හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය වෙත ලබාදෙන ලදි. ඒ ඔස්සේ, හස්තකර්මාන්ත ශිල්පින් 256 දෙනෙකුට නව නිර්මාණ සංවර්ධන හා තාක්ෂණය හදුන්වාදීමේ පුහුණු වැඩසටහන් ඔස්සේ ප්‍රතිලාභ ලබාදීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි.

| දිස්ත්‍රික්කය | ගම්මානය | හස්තකර්මාන්ත ක්ෂේත්‍රය | වියදම රු.මි. | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| අනුරාධපුරය | ලුල්නෑව | රතුමැටි | 0.300 | 42 |
| කෑගල්ල | බල්ලපාන | රතුමැටි | 0.300 | 35 |
| ගම්පහ | වරාගොඩ | රතුමැටි | 0.300 | 35 |
| මාතර | මංගල සමරවීරපුර | කිරිඳි ඇට | 0.300 | 38 |
| අම්පාර | උහන | රතු මැටි | 0.300 | 35 |
| මොනරාගල | සේනාපතිය | වේවැල් | 0.300 | 71 |

## හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වා දීම

හස්තකර්මාන්ත ක්ෂේත්‍රය තුල වෙලඳපලට ගැලපෙන නව නිර්මාණ සැලසුම් කිරීම ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එසේ සැලසුම් කරන ලද නව නිර්මාණ විවිධ ආකාරයෙන් හස්ත කර්මාන්ත ශිල්පියා වෙත යොමු කරවීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය ක්‍රියා කරයි. ක්‍රියාකාරී සැලැස්ම යටතේ, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ , රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් යටතේ සිදුකරනු ලබන නව නිර්මාණ හදුන්වාදීමේ පුහුණු වැඩසටහන් හරහා මෙන්ම ආයතනයේ වැඩහල් වෙත පැමිණ පුහුණුවීම් ලබන්නන් හරහා සහ ශිල්පීන්ගේ ඉල්ලීම හා අවශ්‍යතාවය මත ලබා දෙන නව නිර්මාණ සැලසුම් මඟින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට නව නිර්මාණ හදුන්වාදෙනු ලබයි.

ඒ අනුව ඉහත ආකාරයෙන් 2018 වර්ෂය තුල ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සැලසුම් කරන ලද නව නිර්මාණ 470ක් හදුන්වාදීමට ඉලක්ක කරමින් නව නිර්මාණ 531ක් සත්‍ය වශයෙන් හදුන්වාදීමට කටයුතු කර ඇත.

## හස්ත කර්මාන්ත නව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන "යුගයට නිමැවුම්" නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට සමගාමීව නිෂ්පාදන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර. 2018 වර්ෂයේද එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නිර්මාණය කරනු ලබන නව නිර්මාණ මෙම නිෂ්පාදන සංවර්ධන වැඩසටහන හරහා දිවයින පුරා විසිරී සිටින ශිල්පීය හැකියාවෙන් යුත්, හස්ත කර්මාන්ත ශිල්පීන්ට හඳුන්වාදීම සිදු කරයි.

එසේම, ශිල්පීන්ට මෙම නව නිර්මාණ හඳුන්වාදීමේදී, මෙම නිර්මාණ සිදුකිරීමට අවශ්‍ය දැනුම, තාක්ෂණය ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් ලබාදීම සිදුකරනු ලබන අතර, මෙම නව නිර්මාණ නිෂ්පාදනය කිරීම පිළිබඳ නිරන්තර පසුවිපරම් කිරීම ද සිදු කරයි.

එසේ හස්තකර්මාන්ත ශිල්පීන් විසින් ගුණාත්මක මට්ටමේ වෙළඳපල අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සිදු කරන මෙම නිර්මාණ ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කර පවත්වනු ලබන, =යුගයට නිමැවුම්= නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශනයේ අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, එම අලෙවි ආදායම ශිල්පීන්ට ගලා යාමේ යාන්ත්‍රණයක් මෙම වැඩසටහන හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සම්පාදනය කර ඇත.

ඒ අනුව, 2018 වර්ෂයේ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන සඳහා සියළුම හස්තකර්මාන්ත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ශිල්පීන් 70 දෙනෙකු සම්බන්ධ කරගත් අතර, = යුගයට නිමැවුම්= ප්‍රදර්ශනයේදී ඔවුන්ගේ නව නිර්මාණ අලෙවියෙන් ලද ආදායම රුපියල් මිලියන 1.2ක් විය.

## හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරනු ලබන නව නිර්මාන සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීම යටතේ පහත සඳහන් කාර්යයන් 2018 වර්ෂය තුල සිදු කරන ලදි.

1. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට (ලක්සල) මෙම නව නිර්මාණ හඳුන්වාදීම සහ ලැබෙන ඇණවුම් හස්ත කර්මාන්ත ශිල්පීන් හරහා නිෂ්පාදනය කොට සැපයීම.
2. හස්ත කර්මාන්ත නිෂ්පාදන අලෙවි ක්ෂේත්‍රයේ නියැළී සිටින පෞද්ගලික ආයතන වෙත නව නිර්මාණ හඳුන්වාදීම සහ ලැබෙන ඇණවුම් ශිල්පීන්ට යොමු කොට වෙළඳපල සම්බන්ධතා ගොඩනැගීම
3. වාර්ෂිකව පවත්වනු ලබන "යුගයට නිමැවුම්" නව නිර්මාණ ප්‍රදර්ශණයට සමගාමී නිෂ්පාදන සංවර්ධන වැඩසටහන හරහා ශිල්පීන්ට වෙළඳපල අවස්ථා සලසා දීම හා ලැබෙන ඇණවුම් ශිල්පීන්ට යොමුකොට වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීම.

ඒ අනුව, 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ ශිල්පීන් 100 දෙනෙකු සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීමට ආයතනය ඉල්කක කරන ලද අතර, ඒ යටතේ, ශිල්පීන් 103 දෙනෙකු සඳහා වෙළඳපල සම්බන්ධතා ගොඩනැංවීමට ආයතනය කටයුතු කරන ලදි.

## අලෙවි පර්යේෂණ වැඩසටහන්

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදීමේ අරමුණින් සිදුකරන නව නිර්මාණ සඳහා අලෙවි පර්යේෂන වැඩසටහන් අලෙවි අංශය හරහා සිදුකොට එහි ප්‍රතිඵලයක් වශයෙන්

ඊට අදාල නිරීක්ෂණයන්, මෝස්තර අංශය වෙත ලබාදීම සිදු කරනු ලබන අතර, මෝස්තර අංශය නව නිර්මාණ සිදුකිරීමේදී මෙම දත්ත කෙරෙහි අවධානය යොමු කරයි.

ඒ අනුව. වෙළඳපොල අවශ්‍යතාවයන්ට වඩාත් ගැලපෙන නව නිර්මාණ සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම මෙම අලෙවි පර්යේෂණ වැඩසටහන් හරහා සිදු කරනු ලබයි.

2018 වර්ෂයේ ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා හස්ත කර්මාන්ත නිෂ්පාදන වලට ඇති ඉල්ලුම පිළිබඳ අලෙවි පර්යේෂණ වැඩසටහනක් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේහිදී, 2018 ජුලි 06 සිට 09 දින දක්වා පැවති ගෘහ අභ්‍යන්තර අලංකරණය නිෂ්පාදන ප්‍රමුඛ කොටගත් "හෝම් ඇන්ඩ් යූ" ප්‍රදර්ශණයට නව නිර්මාණ ඉදිරිපත් කරමින් සිදු කරන ලදි.

එමෙන්ම, 2018 දෙසැම්බර් 13 සිට 16 දක්වා පැවති "යුගයට නිමැවුම්" නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය සඳහා මෙම නිර්මාණයන් ඉදිරිපත් කරමින් නව නිර්මාණ පිළිබඳ අලෙවි පර්යේෂන වැඩසටහනක් ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සියලුම හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි අලෙවි අංශය විසින් සිදු කරන ලදි.

## යුගයට නිමැවුම්- 2018 නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව සංවිධානය කර පවත්වනු ලබන "යුගයට නිමැවුම්" 2018 නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත ප්‍රදර්ශණය 2018 දෙසැම්බර් මස 13 දින සිට 16 දින දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ නුග සෙවන පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු කරන ලදි.
ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හදුන්වාදීමේ අරමුණින් සිදුකරන නව නිර්මාණ 350කට අධික ප්‍රමාණයක් මෙම ප්‍රදර්ශනයේදී විළිදැක්වීමට කටයුතු කරන ලද අතර, ප්‍රදර්ශනයට සමගාමී නිෂ්පාදන සංවර්ධන වැඩසටහනට සම්බන්ධ වූ හස්ත කර්මාන්ත ශිල්පීන් 70 දෙනෙකු විසින් සිදු කරන ලද නව නිර්මාණ අලෙවියද මෙම ප්‍රදර්ශනය හරහා සිදු කරන ලදි.

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන "යුගයට නිමැවුම්" 2018 නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත ප්‍රදර්ශණය හරහා පහත සඳහන් අරමුණු ඉටු කරගැනිමට කටයුතු කර ඇත.

- දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් සිදුකරන නව නිර්මාණ වෙළඳපොලට හදුන්වාදීම.
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා හඳුන්වාදෙන නව නිර්මාණ විළිදැක්වීම.
- හස්ත කර්මාන්ත ශිල්පීන් හා හස්ත කර්මාන්ත නිෂ්පාදන ගැණුම්කරුවන් අතර, සම්බන්ධතා ගොඩනැංවීම තුලින් හස්ත කර්මාන්ත නිෂ්පාදන සැපයුම් ජාලය ශක්තිමත් කිරීම.

වාර්ෂිකව පවත්වන මෙම =යුගයට නිමැවුම්= නව නිර්මාණාත්මක හස්තකර්මාන්ත ප්‍රදර්ශණය සඳහා රතුමැටි, දැව, පන් හා කෙඳි, කොහු, පිත්තල, ලාක්ෂා, සම්, ආභරණ,උණ හා වේවැල් සහ රෙදිපිළි මෙන්ම සමරු නිර්මාණ යන ක්ෂේත්‍රයන් යටතේ නව නිර්මාන ඉදිරිපත් කරනු ලබයි.

## ජාතික ශිල්ප සභාව සමඟ සම්බන්ධිකරණය

### ශිල්ප 2018 ජාතික ප්‍රදර්ශණය

ජාතික ශිල්ප සභාව විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන උක්ත ප්‍රදර්ශණයේ පූර්ව රාජකාරි යටතේ දිස්ත්‍රික් මට්ටමින් හස්තකර්මාන්ත ශිල්පීන් දැනුවත් කිරීමේ සියළු වැඩසටහන් සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙමින් නව නිර්මාණ සම්බන්ධ උපදේශකත්වය ලබාදීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරන ලදි.

### අනෙකුත් ආයතන මගින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා දායකත්වය සැපයීම

රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන මගින් සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ දායකත්වය ලබාදෙන ලෙස වර්ෂය පුරා ඉල්ලීම් ලැබෙන අතර, රාජ්‍ය ආයතනයක් වශයෙන් අනිවාර්යයෙන් දායකත්වය දැක්විය යුතු ප්‍රදර්ශන සඳහා දායකත්වය දැක්වීමටත්, අනෙකුත් ඉල්ලීම් වලින් ආයතනයට හා හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට වැදගත් වන ප්‍රදර්ශන තෝරා ගෙන දායකත්වය දැක්වීමට ජාතික මෝස්තර මධ්‍යස්ථානය කටයුතු කරයි.

ඒ අනුව, 2018 වර්ෂය තුල පහත සඳහන් ප්‍රදර්ශන සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය දායකත්වය දක්වන ලදි.

1. සර්වඥධාතූන් වහන්සේලා ඇතුළු ඓතිහාසික වටිනාකමක් ඇති, අරලියගහ මන්දිරයේ අප්‍රේල් 29 සිට මැයි 02 දක්වා පැවති බුද්ධරශ්මි වෙසක් ප්‍රදර්ශණය

2. මුදල් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද අගෝස්තු 29 -31 දක්වා මොනරාගල පැවති ප්‍රදර්ශණය

## පුස්තකාල සේවා සහ තොරතුරු සැපයීම

කටුබැද්ද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙන්ම නත්තරම්පොත ශාඛා කාර්යාලයේ පිහිටි පුස්තකාල සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන හරහා මේ වර්ෂය වෙනුවෙන් රු.මි.0.101 ක වටිනාකමින් යුත් නව පොත් මිලදී ගෙන පුස්තකාලයේ පොත් එකතුව වැඩි කර පුස්තකාලය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදි.

හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල විශේෂිත මෙන්ම දුලබ පොත් එකතුවක් සහිත මෙම පුස්තකාලය හරහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලාවන් හදාරන සිසු සිසුවියන්ට මෙන්ම  හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල අධ්‍යයන කටයුතු වල යෙදෙන විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය දැනුම ලබා ගැනීමට විශාල පිටුවහලක් වන අතර,  ඊට අමතරව හස්තකර්මාන්ත ශිල්පීන්ට හා ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය පුස්තකාල සේවා ලබාදීම,  තොරතුරු සැපයීම හා  පොත් ආශ්‍රයෙන් අවශ්‍ය නිර්මාණයන්හි ඡායා පිටපත් ලබාදීමේ සේවාවද මේ හරහා සිදුකිරීමට කටයුතු කෙරුණි.

## අධ්‍යාපන අංශයේ ක්‍රියාකාරීත්වය

### ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය යටතේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා ජාතික පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව හා ජාතික පිරිනිර්මාණ උසස්  ඩිප්ලෝමා පාඨමාලාව හරහා මෙම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන තරුණ තරුණියන්ට අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දෙමින් ඔවුන්ව වෘත්තිමය නිර්මාණකරුවන් ලෙස සමාජයට මුදා හැරීමට කටයුතු කරයි.

මෙම පාඨමාලාවන් හැදෑරීම තුලින් ලබා ගන්නා  න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම යොදා ගනිමින් ස්වයං ව්‍යාපාර ආරම්භ කිරීමටත්, දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා උදාකර ගැනීමටත් අවස්ථාව ලැබේ.

ඉහත පාඨමාලා සති අන්ත  පාඨමාලා ලෙස ක්‍රියාත්මක කෙරෙන අතර, මෙම වර්ෂය තුල ඉහත පාඨමාලා 02ක පවත්වන ලදි.
මෙම පාඨමාලාවට සම්බන්ධ වූ  සිසු සිසුවියන් පහත පරිදි වේ.

- ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව -2017-2018 (සති අන්ත) මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අවසන් කර අවසන් සමාසික පරීක්ෂණය පවත්වන ලදි. මේ සඳහා සිසුන් 64 දෙනෙකු සහභාගි විය.

- ගෘහ අභ්‍යන්තර පිරිනිර්මාණකරණය පිළිබඳ  උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2018-2019 (සති අන්ත) මෙම පාඨමාලාවේ අධ්‍යයන කටයුතු  2018 වර්ෂයේ අග භාගයේ ආරම්භ කරන ලද අතර, ඒ සඳහා සිසුන් 34 දෙනෙකු බඳවා ගන්නා ලදි.

## ජාතික මෝස්තර මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙනුවෙන් අභිප්‍රේරණ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම - 2018

අප ආයතනය හරහා රටට සිදුවිය යුතු සේවාවන් හා වගකීම් ඉතා කාර්යක්ෂමව, ඵලදායිව උපරිම දායකත්වයෙන් යුතුව ඉටු කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීමේ අරමුණ ඇතිව  සියළු කාර්ය මණ්ඩලය තුල කණ්ඩායම් හැගීම් වර්ධනය, සාමුහිකත්වය හා අන්‍යෝන්‍යය සබැඳියාව වර්ධනය කිරීම  සඳහා

නායකත්ව පුහුණු- ධනාත්මක ආකල්ප සංවර්ධනය ඇතුලත්ව අභිප්‍රේරණ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අප විසින් සැලසුම් කරන ලදි.
ඒ අනුව, මෙම වැඩසටහන 2018.07.20 බණ්ඩාරගම සර්වෝදය පුහුණු ආයතනයේ දී සියළු කාර්ය මණ්ඩලය වෙනුවෙන් සිදු කරන ලදි.

## ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවා ලබාදීම

2018 වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්ම යටතේ , වෙනත් ආයතන වල ඉල්ලීම් යටතේ හා රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිපාදන යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානයෙන් සේවාවන් ලබා ගත් ප්‍රතිලාභීන්ට අමතරව, ඇහවුම් හා අලෙවි අවස්ථා ලබාදීම, වෙළඳපල, හස්ත කර්මාන්ත ශිල්පීන්, ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම, ආයතනයේ වැඩහල තුල ප්‍රායෝගික පුහුණුව ලබාදීම, පොදු පහසුකම් ලබාදීම, ආයතනයට පැමිණ/ ඉල්ලීම් මත මෝස්තර ලබාගැනීම හා වැඩසටහන් සඳහා සහභාගි වීමට අවස්ථාව ලබාදීම වැනි සේවාවන් හරහා සහ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබද උනන්දුවක් දක්වන හා අධ්‍යයන කටයුතු සිදුකරන දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල හා පාසල් සිසුන්ට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය මුල් කරගෙන සිදු කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීම හා ආයතනයට කණ්ඩායම් වශයෙන් පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා ගුරුවරුන්ට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් අවශ්‍ය සේවාවන් ලබාදීම වැනි සේවාවන් යටතේ ජාතික මෝස්තර මධ්‍යස්ථානය ප්‍රතිලාභීන් 1873 දෙනෙකු සඳහා සේවාවන් ලබා දීමට කටයුතු කර ඇත.

## මෝස්තර උපදේශක සේවා

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වෘත්තීය මට්ටමේ මෝස්තර උපදේශක සේවා සැපයීම පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ සිදු කරනු ලැබේ.

- නිර්මාණ සඳහා වන සංකල්ප ගොඩනැගීම
- ගෘහ අභ්‍යන්තර නිර්මාණ කටයුතු
- ප්‍රදර්ශන වලට අදාල නිර්මාණ කටයුතු (අභ්‍යන්තර හා බාහිර)
- සමරු තිළිණ, ස්මාරක සහ සිහිවටන නිර්මාණ
- ග්‍රැෆික් නිර්මාණ

ඒ අනුව, 2018 වර්ෂයේ රාජ්‍ය හා අනෙකුත් ආයතන වල ඉල්ලීම් මත පහත සඳහන් උපදේශක සේවා ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් සපයන ලදී.

1. සර්වඥධාතූන් වහන්සේලා ඇතුළු ඓතිහාසික වටිනාකමක් ඇති, අරලියගහ මන්දිරයේ පැවති බුද්ධ රශ්මි වෙසක් ප්‍රදර්ශණයේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙන්කර ගත් ප්‍රදර්ශන කුටිය නිර්මාණය හා ඉදිකිරීම.

2. ජාතික ශිල්ප සභාව විසින් BMICH හිදී පවත්වන ලද ශිල්ප නවෝදා ප්‍රදර්ශයේ අභ්‍යන්තර සැලසුම් හා සැරසිලි කටයුතු සිදු කිරීම.

3. ශ්‍රීලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට වෙන් කර ඇති කටුනායක ගුවන් තොටුපලෙහි ප්‍රදර්ශන පරිශ්‍රය ගෘහ අභ්‍යන්තර නිර්මාණ සැලසුම් සිදු කිරීම.

4. V-2025 - එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා -මොනරාගල පැවති ප්‍රදර්ශණයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අයත් ප්‍රදර්ශන කුටිය නිර්මාණය කිරීම

## ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නව ගොඩනැගිල්ල සඳහා ප්‍රතිපාදන වෙන් වීම

මොරටුව කටුබැද්දේ පිහිටි ජාතික මෝස්තර මධ්‍යස්ථාන පරිශ්‍රය තුල පැරණි ගොඩනැගිල්ල ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා විමධ්‍යගත අයවැය තුලින් රු.මි.80ක මුදලක් 2017 වර්ෂයේ අනුමත වූ අතර, ඉන් රු.මි.60ක ප්‍රතිපාදන එහි ඉදිකිරීම් කටයුතු සඳහා 2018 වර්ෂයේ දී වෙන් කර ගැනිමට කටයුතු කරන ලද අතර, එහි ඉදිකිරීම් කටයුතු සඳහා මුල්ගල තැබීමේ කාර්යය 2018 මැයි 04 දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම් රංජිත් අශෝක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
### සාරාංශගත වාර්ෂික කාර්ය සාධන වාර්ථාව -2018

| 1. | **ව්‍යාපෘතිය** | **නව නිර්මාණ සැලසුම් කිරීම** | | | | |
|---|---|---|---|---|---|---|
| | **අපේක්ෂිත නිමැවුම** | **වෙන් කිරීම් රු.මි.** | **කාර්ය සාධන නිර්ණායක** | **වාර්ෂික ඉලක්කය** | **ප්‍රගතිය භෞතික** | **ප්‍රගතිය මූල්‍ය** |
| | නව නිර්මාණ සඳහා ප්‍රවේශයන් ඉහල නැංවීම | 4.120 | නව නිර්මාණ සැලසුම් සංඛ්‍යාව | 680 | 835 | 3.193 |
| | | | සකස් කරන ලද මූලික මූලාශ්‍ර සංඛ්‍යාව | 420 | 507 | |
| | | | හස්තකර්මාන්ත ශිල්පීන් සඳහා හඳුන්වාදුන් නව නිර්මාණ සංඛ්‍යාව | 470 | 531 | |
| | | | කාර්ය මණ්ඩල පුහුණුව | 110 | 110 | |
| 2. | **ව්‍යාපෘතිය** | **වැඩහල හා මෝස්තර රසායනාරය අයත් නව ගොඩනැගිල්ල ඉදිකිරීම** | | | | |
| | ජා.මෝ.ම. කාර්ය හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට සපයන සේවාවන් ඉහල නැංවීම | 60.000 | ගොඩනැගිලි සංඛ්‍යාව | 01 | ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී 80% | 31.628 |
| 3. | **ව්‍යාපෘතිය** | **නව නිර්මාණ හා නව තාක්ෂණික දැනුම ලබාදීම** | | | | |
| | නව නිර්මාණ හා නව තාක්ෂණය හඳුන්වාදීම තුලින් හස්තකර්මාන්ත ශිල්පීන්ගේ දැනුම හා හැකියාවන් ඉහල නැංවීම | 3.920 | පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 30 | 34 | 3.131 |
| | | | පුහුණුව සඳහා ලද ඉල්ලීම් සංඛ්‍යාව | 07 | 10 | |
| | | | වැඩහලට පැමිණ පුහුණුව ලැබූ සංඛ්‍යාව | 50 | 83 | |
| | | | පුහුණුව ලැබූ ශිල්පීන් සංඛ්‍යාව | 600 | 823 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4. | **ව්‍යාපෘතිය** | **ආදේශන අමුද්‍රව්‍ය හා ක්‍රියාවලින් හදුන්වාදීම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්** | | | | |
| | හස්තකර්මාන්ත ශිල්පින්ගේ දැනුම හා හැකියාවන් ඉහල නැංවීම | 2.160 | හදුන්වාදුන් නව සොයා ගැනීම් සංඛ්‍යාව | 03 | 02 (01ක් ක්‍රියාත්මක තත්වයේ පවතී) | 0.627 |
| 5. | **ව්‍යාපෘතිය** | **නව හස්තකර්මාන්ත නිෂ්පාදන ප්‍රචලිත කිරීම හා ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම** | | | | |
| | නව වෙළඳපල සඳහා ප්‍රවේශයන් ඉහල නැංවීම | 9.800 | වෙළඳපල ප්‍රචලිත නව නිර්මාන | 250 | 286 | 7.807 |
| | | | වෙළඳපල සම්බනධතා සංඛ්‍යාව (ශිල්පීන්) | 100 | 103 | |
| | | | නව නිර්මාණ ප්‍රදර්ශන සංඛ්‍යාව | ප්‍රධාන -01 අනෙකුත් - 05 | ප්‍රධාන -01 අනෙකුත් - 02 | |
| | **ප්‍රාග්ධන ප්‍රතිපාදන - මුළු එකතුව** | 80.000 | | | | 46.386 |
| | **අපේක්ෂිත නිමැවුම** | **වෙන් කිරීම් රු.මි.** | **කාර්ය සාධන නිර්ණායක** | **වාර්ෂික ඉලක්කය** | **ප්‍රගතිය** | |
| | | | | | **භෞතික** | **මූල්‍ය** |
| | **ව්‍යාපෘතිය** | **ජාතික පිරිනිර්මාණ විද්‍යාලය හරහා ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම** | | | | |
| | ගෘහ අභ්‍යන්තර අලංකරණ හා නිෂ්පාදන සඳහා නව සැලසුම් පිළිබඳ හැකියාවන් හා දැනුම ඉහල නැංවීම | ඉපයූ ප්‍රතිපාදන | ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව | 70 | 2017 පාඨමාලාව දැනට ක්‍රියාත්මක වෙමින් පවතී | |
| | | | ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කල සිසුන් සංඛ්‍යාව | 60 | 63 | |
| | | | උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කල සිසුන් සංඛ්‍යාව | 40 | 34 | |
| | | | උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කල සිසුන් සංඛ්‍යාව | 30 | ක්‍රියාත්මක වෙමින් පවතී | |
| | **ව්‍යාපෘතිය** | **මෝස්තර උපදේශක සේවා** | | | | |
| | සේවායෝජකයින්ගේ ඉල්ලීම මත වඩාත් හොඳ සේවාවක් ලබා දීම | බාහිර ප්‍රතිපාදන යටතේ | සපයන ලද උපදේශක සේවා සංඛ්‍යාව | 03 | 04 | |

# නිෂ්පාදන - 2018

## රෙදිපිළි





## රතු මැටි





## කොහු





# නිෂ්පාදන - 2018

## දැව








## පන් හා කෙඳි







## උණ හා වේවැල්







## පිත්තල







## ආභරණ








## ලාක්ෂා







## ලෙදර්







# යුගයට නිමැවුම් - 2018 නව නිර්මාණ ප්‍රදර්ශනය
# බණ්ඩාරනායන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව - කොළඹ






















# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අවසාන ගිණුම්

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
## 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 1 | 68,938,678.95 | 53,984,062.04 |
| | | 68,938,678.95 | 53,984,062.04 |
| **ජංගම වත්කම්** | | | |
| අග තොගය | 2 | 6,141,102.25 | 6,922,938.26 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | 3 | 16,500,577.78 | 7,996,367.31 |
| සේවක ණය | 4 | 11,204,694.38 | 8,252,070.22 |
| පෙර ගෙවුම් | 5 | 362,183.82 | 446,481.68 |
| මුදල් හා සමාන දෑ | 6 | 17,714,350.23 | 21,932,982.19 |
| | | 51,922,908.46 | 45,550,839.66 |
| මුළු වත්කම් | | 120,861,587.41 | 99,534,901.70 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු | 7 | 5,040,774.72 | 968,664.30 |
| UNDP වැඩසටහනට අත්තිකාරම් වශයෙන් ලද මුදල් | 8 | 4,634,144.05 | 7,352,810.00 |
| උපචිත වියදම් | 9 | 1,706,655.07 | 1,890,132.73 |
| ජංගම නොවන බැරකම් | | 11,381,573.84 | 10,211,607.03 |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | 10 | 25,036,671.00 | 24,790,020.50 |
| මුළු වගකීම් | | 36,418,244.84 | 35,001,627.53 |
| **මුළු ශුද්ධ වත්කම්** | | **84,443,342.57** | **64,533,274.17** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| විලම්භිත අයභාර ආදායම් | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | | 79,492,290.03 | 53,285,721.17 |
| අඩු කළා | | | |
| ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම් පවත්නා වර්ෂය | 11.1 | 7,337,317.89 | 8,385,431.14 |
| අඩු කළා | | | |
| විලම්භිත අයභාර වියදම් කපා හැරීම | | 72,154,972.14 | 44,900,290.03 |
| විලම්භිත අයභාර වියදම් | 11.2 | 12,062,543.19 | 11,720,000.00 |
| | | 60,092,428.95 | 33,180,290.03 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 6,578,345.91 | 6,578,345.91 |
| සමුච්චිත අරමුදල | 12 | 17,772,567.71 | 24,774,638.23 |
| මුළු ශුද්ධ වත්කම් ස්කන්ධය | | **84,443,342.57** | **64,533,274.17** |

10-11 පිටුවේ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසක 12 සිට 25 දක්වා සටහන්.

සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| ................................ | ......................................... | ..................................... | ....................................... |
| බී.ආර්. රණවීර | එම්. ඒ. එස්. එස්. කේ. චන්ද්‍රසිරි | ඒ. එල්. එම්. මිල්හාන් | එම්.එම්. අබ්දුල් කාදර් |
| ගණකාධිකාරී | අධ්‍යක්ෂ | සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 24.02.2019 | 25.02.2019 | 25.02.2019 | 25.02.2019 |

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
## 2018 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යඵල ප්‍රකාශය

| | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම්** | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන-පුනරාවර්තන | 13 | 61,029,188.00 | 58,023,332.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන- සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා | | 12,062,543.19 | 11,720,000.00 |
| සංවර්ධන කටයුතු සඳහා අමාත්‍යාංශයෙන් ලදප්‍රධාන | | 13514451.28 | 12422059.01 |
| සංවර්ධන කටයුතු සඳහා වූ ජාතික ශිල්ප සභාවේ ලද මුදල් | | 1527335.81 | - |
| වෙනත් ආදායම් | 14 | 5,165,465.16 | 20,784,596.52 |
| | | 93,298,983.44 | 102,949,987.53 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| සේවක පඩිනඩි | 15 | 51,135,231.18 | 47,805,665.75 |
| ගමන් වියදම් | 16 | 248,483.37 | 753,952.06 |
| සැපයුම් සේවා | 17 | 1,077,432.46 | 962,770.61 |
| නඩත්තු කටයුතු | 18 | 2,414,594.23 | 1,981,631.57 |
| ගිවිසුම් ගත සේවා | 19 | 7,575,706.63 | 6,337,756.09 |
| ක්ෂය වීම් | 20 | 7,337,317.89 | 8,385,431.14 |
| පාරිතෝෂිත | | 2,536,868.50 | 1,685,095.00 |
| සංවර්ධන වියදම් | 21 | 11,188,773.24 | 10,268,351.52 |
| ව්‍යාපාර ගම්මාන සහ කාන්තා ව්‍යවසාය සංවරධනය | 22 | 15,029,606.62 | 12,684,113.50 |
| වෙනත් වියදම් | 23 | 7,011,542.81 | 12,799,256.35 |
| | | 105,555,556.93 | 103,664,023.59 |
| මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය / (ඌණතාවය) | | (12,256,573.49) | (714,036.06) |
| ගෙඩනැගිලි ඉවත් කිරීම් | | (2,082,814.92) | - |
| | | (14,339,388.41) | (714,036.06) |
| <u>එකතු කළා</u> | | | |
| විලම්භිත ආදායම් | | 7,337,317.89 | 8,385,431.14 |
| වර්ෂයේ අතිරික්තය / (ඌණතාවය) | | **(7,002,070.52)** | **(7,671,395.08)** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය - වක්‍ර ක්‍රමය
## ජාතික මෝස්තර මධ්‍යස්ථානය
## 2018.12.31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය</u> | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් අතිරික්ත/හිගය | (12,256,573.49) | | (714,036.06) | |
| (+) පෙර වර්ෂය සඳහා ගැලපීම් | - | | - | |
| (-) පෙර වර්ෂය සඳහා ගැලපීම් | - | (12,256,573.49) | - | (714,036.06) |
| <u>මුදල් නොවන චලනයන්</u> | | | - | |
| ක්ෂය වීම | 7,497,901.42 | | 8,443,305.55 | |
| අවසන් වර්ෂය සඳහා ක්ෂය ගැලපීම | (15,930.00) | | | |
| පාරිතෝෂිත | 2,536,868.50 | | 1,685,095.00 | |
| අවසන් තොග (වැඩිවීම) / අඩුවීම | 781,836.01 | | (1,186,2016.67) | |
| අඩු / (වැඩි) වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු | (8,504,210.47) | | (4,219,840.40) | |
| අඩු / (වැඩි) ලැබිය යුතු සේවක ණය | (2,952,624.16) | | (1,311,860.70) | |
| පෙර ගෙවුම් අඩුවීම් / (වැඩිවීම්) | 84,297.87 | | 47328.81 | |
| (අඩු) / වැඩි වෙළඳ හා අ◌ෙනකුත් ගෙවිය යුතු | 4,072,110.42 | | ( 464,584.91 ) | |
| යූ.එන්.ඩී.පී. වැඩසටහන සඳහා ලද මුදල් | ( 2,718,665.95) | | (1,668,522.00) | |
| පාරිතෝෂිත ගෙවීම් | (2,290,218.00) | | (2,921,681.00) | |
| (අඩු) / වැඩි උපචිත වියදම් | (183,477.66) | (1,692,112.03) | (147,006.12) | (1,744,182.22) |
| මෙහෙයුම් කටයුතු වලින් ලත් ශුද්ධ මුදල් | | (13,948,685.52) | | (2,485,218.50) |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය</u> | | | | |
| ගොඩනැගිලි මිලදී ගැනීම (ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමට | (821,245.00) | | (1,035,667.00) | |
| නව ගොඩනැගිල්ල සඳහා වියදම් | (21,238,936.86) | | (496,850.00) | |
| ගොඩනැගිලි ගිණුම සඳහා මාරු කිරීම- නිමවෙමින් පවතින | 945,360.00 | | - | |
| යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් | (127,962.50) | | (170,111.21) | |
| ලී බඩු මිලදී ගැනීම් | (2,074,061.87) | | (285,821.60) | |
| කාර්යාල උපකරණ මිලදී ගැනීම | (409,684.00) | | (177,428.50) | |
| මෙවලම් මිලදී ගැනීම | (174,375.00) | | (304,264.30) | |
| පුස්තකාල පොත් මිලදී ගැනීම | (110,943.02) | | (2,535,900.00) | |

| | | | | |
|---|---|---|---|---|
| පරිඝණක සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම | (1,013,305.00) | | - | |
| ගොඩනැගිලි ඉවත් කිරීමේ කුවිතාන්සිය | 505,750.00 | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය** | | (24,519,403.25) | | (5,006,042.61) |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහය</u>** | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාරය | 34,249,456.81 | | 5,174,000.00 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ද මුදල් ප්‍රවාහය** | | 34,249,456.81 | | 5,174,000.00 |
| මුදල් හා සමාන දෑ වැඩිවීම / (අඩුවීම) | | (4,218,631.96) | | (2,290,261.11 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා සමාන දෑ | | 21,932,982.19 | | 24,223,242.88 |
| වර්ෂය අවසානයේදී මුදල් හා සමාන දෑ | | 17,714,350.23 | | 21,932,982.19 |

## 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රග්ධන ප්‍රදාන රු. | සමුච්චිත අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | මුලු මුදල රු. |
|---|---|---|---|---|
| 2018.01.01 දිනට ශේෂය | 33,180,290.03 | 24,774,638.23 | 6,578,345.91 | 64,533,274.17 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් | - | - | - | - |
| මූලික දෝෂ | - | - | - | - |
| විලම්භිත අයභාර වියදම් කපා හැරීම | (12,062,543.19) | - | - | (12,062,543.19) |
| ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම | (7,337,317.89) | - | - | (7,337,317.89) |
| ප්‍රත්‍යාගණන සංචිත | - | - | - | - |
| භාණ්ඩාගාර ප්‍රදාන - මුදල් | 46,312,000.00 | | | 46,312,000.00 |
| මූල්‍ය කාර්යඵල ප්‍රකාශය | - | - | - | - |
| විදේශ මුදල් පරිවර්තන වෙනස | - | - | - | - |
| කාලච්ඡේදයේ අතිරික්තය / හිගය | - | (7,002,070.52) | - | (7,002,070.52) |
| 2018.12.31 දිනට ශේෂය | 60,092,428.95 | 17,772,567.71 | 6,578,345.91 | 84,443,342.57 |

## ජාතික මෝස්තර මධ්‍යස්ථානය

## 2018 වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 01. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. ගිණුම් වලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු වෙනස් කිරීමක් කර නොමැති අතර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් සකස් කර ඇත.

### 02. රජයේ ප්‍රතිපාදන

පුනරාවර්තන හා ප්‍රාග්ධනය යන ක්‍රම දෙකෙන් ආයතනවලට ප්‍රදාන දෙනු ලැබේ.

### 03. ක්ෂය වීම

පහත සඳහන් වාර්ෂික අනුපාතයන්ට අනුව හීනවන ක්ෂය ක්‍රමය මත ස්පර්ශ්‍ය ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් ලබා දී ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| කාර්යාල උපකරණ | 10% |
| පරිගණක සහ උපාංග | 20% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෙවලම් සහ උපකරණ | 25% |
| මෝටර් වාහන | 20% |
| යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 15% |
| පුස්තකාල පොත් | 5% |

### 04. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ආයතනවල ආදායම රජයේ ප්‍රදාන සහ වෙනත් විවිධ ආදායම් වලින් නියෝජනය වේ. සියලුම ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 05. තොග තක්සේරු කිරීම

තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයයක අගයන්ගෙන් අඩුම අගය මත ගණනය කර ඇත. තොග නිකුත්කිරීම පෙර පිවිසි පෙර නිකුත් ක්‍රමයට අනුව සිදුකර ඇත.

**06. පසු ශේෂ පත්‍ර සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු සියලුම හඳුනාගත් ප්‍රමාණාත්මක සිදුවීම සඳහා ගැලපීම කර ඇත.

07. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් හිමිකාරිත්වය ආයතනයට පවරා නොමැති බැවින් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ ව්‍යාපෘති කාර්යාල ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත.

**08. හෙළි කළ යුතු නීතිමය නඩු**

ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරමින් 2009 දී ආයතනය විසින් භූමි අලංකරණ සේවා සඳහා කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කරන ලදී. 580,000 / -. ආයතනයේ තෘප්තිය සඳහා නියමිත කාල සීමාව තුළ එකඟ වූ වැඩ නිම කිරීමට කොන්ත්‍රාත්කරුට නොහැකි වූ බැවින් කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම අත්හිටුවා ඇත. කොන්ත්‍රාත්කරු මේ සම්බන්ධයෙන් නඩුවක් ගොනු කර ඇති අතර ගිවිසුම්ගත මුදල් නොගෙවීම වෙනුවෙන් වන්දි ඉල්ලා ඇත.

සම්පූර්ණ කරන ලද වැඩ සඳහා යම් ගෙවීමක් කළ යුතු බව ආයතනයෙහි අදහසයි. මෙම මුදල රු. 502,082.56 කි. කෙසේ වෙතත් අවසාන තීරණයට තවමත් එළඹ නැත.

සම්පූර්ණ කරන ලද වැඩ සඳහා යම් ගෙවීමක් කළ යුතු බව ආයතනයෙහි අදහසයි. මෙම මුදල රු. 502,082.56 කි. කෙසේ වෙතත් අවසාන තීරණයට තවමත් එළඹ නැත.

09. ආයතනයේ වසර පහක සේවා කාලය සම්පූර්ණ කළ සේවකයින් සඳහා පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

10. නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කාර්යාල පරිශ්‍රයේ පිහිටි පැරණි ගොඩනැගිල්ලේ කොටසක් 2018 වර්ෂය තුළදී කඩා ඉවත් කර ඇත.

11. ජාතික මෝස්තර මධ්‍යස්ථානය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2018 මාර්තු මස මොරටුව හි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 80 යි.

## 1.දේපල පිරියත හා උපකරණ

| | ගොඩනැගිලි | නිම නොවූ වැඩ | යන්ත්‍රෝපකරණ | වාහන | පරිගණක | කාර්යාල උපකරණ | ලී බඩු සහ සවිකිරීම් | මෙවලම් හා උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු | රු. | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| පිරිවැය | | | | | | | | | | |
| 2018.01.01 දිනට ශේෂය | 23,613,653.50 | | 6,771,834.58 | 25,610,000.00 | 14,285,513.84 | 11,939,792.98 | 8,176,082.77 | 1,119,271.64 | 3,060,514.04 | 94,576,663.35 |
| 2017 සදහා ගැලපීම් | (945,360.00) | | | | | | | | | (945,360.00) |
| වර්ෂය සදහා ඉවත් කිරීම් | (4,006,964.56) | | | | | | | | | (4,006,964.56) |
| වර්ෂය සදහා ප්‍රත්‍යාගණන | | | | | | | | | | |
| වර්ෂය තුල එකතුකිරීම් | 821,245.00 | 21,238,936.86 | 127,962.50 | | 1,013,305.00 | 409,684.00 | 2,074,061.87 | 174,375.00 | 110,943.02 | 25,970,513.25 |
| 2018.12.31 දිනට ශේෂය | 19,482,573.94 | 21,238,936.86 | 6,899,797.08 | 25,610,000.00 | 15,298,818.84 | 12,349,476.98 | 10,250,144.64 | 1,293,646.64 | 3,171,457.06 | 115,594,852.04 |
| ක්ෂය වීම් | | | | | | | | | | |
| 2018.01.01 දිනට ශේෂය | 10,501,771.07 | | 3,812,887.32 | 5,127,717.71 | 7,724,393.71 | 8,435,199.45 | 3,422,699.26 | 821,747.85 | 746,184.94 | 40,592,601.31 |
| 2017 සදහා ගැලපීම් | (15,930.00) | | | | | | | | | (15,930.00) |
| ඉවත් කිරීම් | (1,418,399.64) | | | | | | | | | (1,418,399.64) |
| වර්ෂය සදහා ප්‍රත්‍යාගණන | | | | | | | | | | |
| වර්ෂය තුල ක්ෂය වීම් | 463,310.29 | | 450,745.75 | 4,096,456.45 | 1,346,605.75 | 358,011.46 | 583,278.84 | 82,593.78 | 116,899.10 | 7,497,901.42 |
| 2018.12.31 දිනට ශේෂය | 9,530,751.72 | - | 4,263,633.07 | 9,224,174.16 | 9,070,999.46 | 8,793,210.91 | 4,005,978.10 | 904,341.63 | 863,084.04 | 46,656,173.09 |
| ශුද්ධ පොත් අගය | | | | | | | | | | |
| 2018.01.01 දිනට ශේෂය | 13,111,882.43 | | 2,958,947.26 | 20.482.282.29 | 6,561,120.13 | 3,504,593.53 | 4,753,383.51 | 297,523.79 | 2,314,329.10 | 53,984,062.04 |
| 2018.12.31 දිනට ශේෂය | 9,951,822.22 | 21,238,936.86 | 2,636,164.01 | 16,385,825.84 | 6,227,819.38 | 3,556,266.07 | 6,244,166.54 | 389,305.01 | 2,308,373.02 | 68,938,678.95 |

## සටහන 02 - අවසාන තොග

| | | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|---|
| | | රු. | රු. |
| අමු ද්‍රව්‍ය | | 635,761.31 | 785,919.88 |
| නිමි තොග | 2.1 | 4,733,569.09 | 5,399,000.51 |
| ලිපි ද්‍රව්‍ය | | 755,251.85 | 696,752.87 |
| DCF තොග | 2.2 | 16,520.00 | 41,265.00 |
| | | 6,141,102.25 | 6,922,938.26 |

## සටහන 2.1 - නිමි තොග

| | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|
| | රු. | රු. |
| සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව නිමි භාණ්ඩ | 4,947,794.09 | 5,488,575.48 |
| අඩු කළා- අතිරික්ත / (හිඟ) ගැලපුම | (55,066.00) | 3,365.00 |
| භාවිතා කළ නොහැකි නිමි භාණ්ඩ | (159,159.00) | (92,939.97) |
| | 4,733,569.09 | 5,399,000.51 |

## සටහන 2.2 - නිමි තොග

| | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රධාන කාර්යාලයේ තොගය | 13,200.00 | 22,225.00 |
| නියෝජන තොගය | 3,320.00 | 19,040.00 |
| | 16,520.00 | 41,265.00 |

## සටහන 03- වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| අත්තිකාරම් මුදලින් | 15,228.22 | 59,138.22 |
| අත්තිකාරම් චෙක්පත් | - | 40,000.00 |
| අත්තිකාරම් තැන්පතු | 8,894.55 | 103,115.55 |
| ලැබිය යුතු මුදල් අත්තිකාරම් - පෙන්ත්හවුස් පුද්ගලික සමාගම 3.1 | 1,096,184.82 | 4,445,342.54 |
| මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය | 221,452.85 | - |
| තැන්පතු | | |
| දුරකථන තැන්පතු | 11,950.00 | 11,950.00 |
| ඉන්ධන තැන්පතු | 10,000.00 | 10,000.00 |
| පුවත් පත් තැන්පතු | 300.00 | 300.00 |
| සිලින්ඩර් තැන්පතු | 6,500.00 | 3,000.00 |
| වෙනත් තැන්පතු | 77,600.00 | 77,600.00 |
| විදුලි තැන්පතු | 20,000.00 | 20,000.00 |
| ඉන්ධන තැන්පතු ලංකා අයි.ඕ.සී. | 200,000.00 | - |
| **මෝස්තර අධ්‍යාපන ගිණුම** | | |
| ලැබිය යුතු පංති ගාස්තු | 377,500.00 | 561,000.00 |
| ගොඩනැගිලි කුලී තැන්පතු | 510,000.00 | 510,000.00 |
| **මෝස්තර උපදේශක සේවා ගිණුම** | | |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | 561,045.00 | 984,555.00 |
| බෙයාලුට් | 26,400.00 | 26,200.00 |
| අත්තිකාරම් | 296,666.00 | 335,666.00 |
| ආරක්ෂක සේවා අණ කාර්ය මණ්ඩල විද්‍යාලය | - | 550,000.00 |
| කාර්යය සාධන බැදුම්කර | - | 55,000.00 |
| ගාලු උරුම පදනම | - | 200,000.00 |
| ගන්ධරා | 64,200.00 | - |
| | 16,500,577.78 | 7,996,367.31 |

## සටහන 03.1 - ලැබිය යුතු මුදල්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ජාතික ශිල්ප සභාව | 787,306.28 | 343,319.23 |
| ශාලා වෙන්කරවා ගැනීම සඳහා | 182,398.10 | - |
| කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විකුණුම් | 126,480.44 | - |
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | - | 4,102,023.31 |
| | 1,096,184.82 | 4,445,342.54 |

## සටහන 04 - සේවක ණය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ආපදා ණය | 11,033,594.38 | 8,009,796.22 |
| උත්සව අත්තිකාරම් | 23,600.00 | 14,850.00 |
| විශේෂ අත්තිකාරම් (ගං වතුර) | 142,140.00 | 227,424.00 |
| පාපැදි ණය | 5,360.00 | - |
| | 11,204,694.38 | 8,252,070.22 |

## සටහන 05 - පෙරගෙවුම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| රක්ෂණ | 257,509.43 | 250,039.52 |
| ගිවිසුම් සේවා | 59,490.63 | 41,135.40 |
| බලපත්‍ර | 33,368.76 | 33,368.76 |
| තැපැල් | 11,815.00 | - |
| ඉන්ධන | - | 121,938.00 |
| | 362,183.82 | 446,481.68 |

## සටහන 06 - මුදල් හා සමාන දෑ

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම - ගිණුම් අංක 407273 | 619,991.09 | 2,780,511.47 |
| ජාතික මෝස්තර මධ්‍යස්ථාන ගිණුම තන්තරම්පොත | 15,817.77 | 31,778.00 |
| මෝස්තර උපදේශක සේවා ගිණුම - ගිණුම් අංක 407326 | 11,835,233.00 | 12,062,068.31 |
| මෝස්තර අධ්‍යාපන ගිණුම | 4,214,914.86 | 6,479,526.43 |
| සේවක ණය ගිණුම- ගිණුම් අංක 407325 | 1,028,393.51 | 579,097.98 |
| | 17,714,350.23 | 21,932,982.19 |

## සටහන 07 - වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්

| | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|
| | රු. | රු. |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 1,544,725.00 | 630,000.00 |
| තැන්පතු (Procons පුද්ගලික සමාගම සහ Seylak Properties) | 45,358.00 | 28,657.50 |
| කාර්මික සංවර්ධන මණ්ඩලය | 492,660.00 | - |
| සීමාසහිත පෙන්ත්හවුස් පුද්ගලික සමාගම ගොඩනැගිලි සඳහා | 488,723.61 | - |
| අවලංගු කරන ලද චෙක්පත් | 7,750.00 | - |
| රඳවා ගැනීමේ මුදල් පෙන්ත්හවුස් පුද්ගලික සමාගම | 1,395,145.30 | - |
| රඳවා ගැනීමේ මුදල් සකුරා ව්‍යාපෘතිය සහ අභ්‍යන්තර අලංකරණ ආයතනය | 57,288.00 | - |
| රඳවා ගැනීමේ මුදල් යූ.ජී. විමසිරි | 14,094.00 | - |
| රඳවා ගැනීමේ මුදල් යූ.ජී. ගුණරත්න | 10,750.00 | - |
| රඳවා ගැනීමේ මුදල් ටෙලිසොනික් ලංකා | 4,030.00 | - |
| ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතුව | 5,500.00 | - |
| **මොස්තර අධ්‍යාපන ගිණුම** | | |
| ආරක්ෂක තැන්පතුව | 29,302.00 | - |
| අත්තිකාරම් වශයෙන් ලැබෙන පන්ති ගාස්තු | 555,000.00 | - |
| ටෙලිසොනික් ලංකා සමාගම | 32,387.51 | - |
| ගතික රෙදි නිපදවන්නන් | 30,535.75 | - |
| ඩිසයින් වර්ල්ඩ් පුද්ගලික සමාගම. | 17,393.75 | - |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 125.00 | - |
| **මෝස්තර උපදේශන ගිණුම** | | |
| තල් සංවර්ධන මණ්ඩලය | 310,006.80 | 310,006.80 |
| | 5,040,774.72 | 968,664.30 |

## සටහන 8 - යූ. එන්. ඩී. පී. ව්‍යාපෘතිය සඳහා ලැබූ අත්තිකාරම් මුදල

(උතුරු පළාතේ තෝරාගත් පේෂකර්මාන්ත නිෂ්පාදන කණ්ඩායම් සඳහා තාක්ෂණික සංවර්ධනය සහ වෙළඳපල සම්බන්ධතා සඳහා විශේෂ ව්‍යාපෘතිය)

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ලැබූ මුදල | 7,352,810.00 | 20,903,767.04 |
| වැඩ අවසන් | (2,718,665.95) | 13,550,957.04 |
| ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ගිණුමේ ශේෂය | 4,634,144.05 | 7,352,810.00 |

## සටහන 09 - උපචිත වියදම්

| | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|
| | රු. | රු. |
| ඉන්ධන | 17,624.45 | 10,384.30 |
| දුරකථන | 108,882.92 | 66,376.87 |
| විදුලිය | 35,268.18 | 30,912.73 |
| පුවත් පත් | 7,750.00 | 3,410.00 |
| ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් | 406,591.15 | 417,495.16 |
| ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් | 101,647.78 | 104,373.79 |
| ජලය | 26,805.02 | 10,529.37 |
| නව නිර්මාණ ප්‍රදර්ශනය | 364,540.76 | 197,857.34 |
| අතිකාල | 61,180.74 | 63,853.68 |
| ගමන් වියදම් | 13,610.75 | 3,858.00 |
| වැටුප් හා වේතන | 271,060.76 | 278,330.10 |
| මෝස්තර සංවර්ධන | 32,330.00 | - |
| ආරක්ෂක ගාස්තු | - | 47,506.50 |
| මූලාකෘති සාම්පල සහ තෑගි භාණ්ඩවල පිරිවැය | 2,685.66 | - |
| වෙනත් දීමනා | 8,000.00 | - |
| තොග පදනම මත භාණ්ඩ සඳහා ගෙවිය යුතු | 43,850.00 | - |
| ගොඩනැගිලි නඩත්තු (ජයන්ත එන්ටර්ප්‍රයිසස්) | - | 227,810.00 |
| වෙනත් ප්‍රදර්ශනය | 8,650.40 | 11,188.03 |
| දැන්වීම් | - | 43,470.00 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 2,500.00 | 500.00 |
| සේවක පුහුණුව | 25,000.00 | |
| වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම | 28,107.50 | |
| **මෝස්තර අධ්‍යාපන ගිණුම** | | |
| දේශන ගාස්තු | 64,000.00 | 76,350.00 |
| අතිකාල | - | 3,665.00 |
| දීමනා | - | 11,500.00 |
| කුලී | 74,010.48 | 73,666.66 |
| දුරකථන | 628.97 | - |
| විදුලිය | 1,929.55 | - |
| **මෝස්තර උපදේශක ගිණුම** | | |
| පාස් ඒෂියන් පුද්ගලික සමාගම | - | 171,000.00 |
| ඩබ්.එස්.ජයනිතා | - | 26,750.00 |
| අතිකාල | - | 3,845.20 |
| යූ.එන්.ඩී.පී. දීමනාව | - | 5,500.00 |
| | 1,706,655.07 | 1,890,123.73 |

## සටහන 10 - 31.12.2018 දිනට පාරිතෝෂික වෙන් කිරීම

| | සේවකයාගේ නම 1 | සේවයට බැඳුන දිනය | 2018/12/31 දිනට සම්පූර්ණ වසර ගණන 3 | වැටුප 4 | 5 | 2018/12/31 දිනට පාරිතෝෂික වෙන් කිරීම (6) =(3) x (5) |
|---|---|---|---|---|---|---|
| 1 | ටී අශෝකා තිරිමාන්න | 26/09/1983 | 35 | 39,022.00 | 19,511.00 | 682,885.00 |
| 2 | යූ.එල්. වික්‍රමරත්න | 10/6/1985 | 33 | 41,716.00 | 20,858.00 | 688,314.00 |
| 3 | පී. ධර්මසේන | 24/06/1985 | 33 | 38,260.00 | 19,130.00 | 631,290.00 |
| 4 | එම්.එස්. නාලිනී | 25/10/1985 | 33 | 41,716.00 | 20,858.00 | 688,314.00 |
| 5 | ජී. විතානගේ | 1/11/1985 | 33 | 50,555.00 | 25,277.50 | 834,157.50 |
| 6 | මානෙල් බුලත්ගම | 6/12/1985 | 33 | 49,448.00 | 24,724.00 | 815,892.00 |
| 7 | ඩී. ධර්මසිරි | 10/6/1986 | 32 | 36,304.00 | 18,152.00 | 580,864.00 |
| 8 | යූ.ජී.ජී. අමරතුංග | 26/10/1986 | 26 | 36,910.00 | 18,455.00 | 479,830.00 |
| 9 | ටී.එන්. කරුණාරත්න | 21/11/1986 | 31 | 39,244.00 | 19,622.00 | 608,282.00 |
| 10 | එච්.එම්.ඒ.යූ.ශාන්ත | 8/12/1986 | 32 | 44,788.00 | 22,394.00 | 716,608.00 |
| 11 | ජී.ඩබ්. රම්‍යලතා | 16/03/1987 | 31 | 39,796.00 | 19,898.00 | 616,838.00 |
| 12 | අයි.ආර්.පියතිලක | 17/06/1987 | 30 | 39,448.00 | 19,724.00 | 591,720.00 |
| 13 | ඩී.ජේ. පීරිස් | 11/11/1987 | 31 | 50,555.00 | 25,277.50 | 783,602.50 |
| 14 | එම්.ඒ. සෝමලතා | 1/3/1988 | 30 | 62,186.00 | 31,093.00 | 932,790.00 |
| 15 | ඩබ්.ඒ.පී.කේ. විජේසිංහ | 1/8/1988 | 30 | 63,305.00 | 31,652.50 | 949,575.00 |
| 16 | පාලිත පුෂ්පකුමාර | 15/04/1988 | 30 | 37,684.00 | 18,842.00 | 565,260.00 |
| 17 | ඩබ්.ඒ. කුලතිලක | 1/6/1988 | 30 | 36,910.00 | 18,455.00 | 553,650.00 |
| 18 | කේ.පී.ජේ. පෙරේරා | 14/02/1989 | 29 | 37,102.00 | 18,551.00 | 537,979.00 |
| 19 | බී.කේ.කේ.පෙරේරා | 28/06/1989 | 29 | 36,826.00 | 18,413.00 | 533,977.00 |
| 20 | මානෙල් රාජපක්ෂ | 2/10/1989 | 29 | 44,644.00 | 22,322.00 | 647,338.00 |
| 21 | යූ.ඒ.එල්.එස්.කේ. ජයතිස්ස | 1/1/1990 | 28 | 36,910.00 | 18,455.00 | 516,740.00 |
| 22 | ආර්.ඒ.පී. උදයංගනී | 20/02/1990 | 27 | 41,716.00 | 20,858.00 | 563,166.00 |
| 23 | කේ.කේ.එස්. ද සිල්වා | 15/08/1991 | 27 | 43,248.00 | 21,624.00 | 583,848.00 |
| 24 | එම්.කේ.මහින්ද | 1/7/1992 | 26 | 39,796.00 | 19,898.00 | 517,348.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 25 | ජී.ඒ.ජී.සිල්වා | 22/03/1993 | 25 | 36,904.00 | 18,452.00 | 461,300.00 |
| 26 | එල්.ඒ. කුලරත්න | 5/4/1993 | 25 | 36,904.00 | 18,452.00 | 461,300.00 |
| 27 | එච්.බී.ටී. දමයන්ති | 3/1/1994 | 24 | 57,710.00 | 28,855.00 | 692,520.00 |
| 28 | බී.කේ.ඒ. රොඩ්රිගෝ | 15/06/1994 | 24 | 36,526.00 | 18,263.00 | 438,312.00 |
| 29 | ඒ.එම්.ටී.කේ. අලගියවන්න | 2/5/1996 | 22 | 35,812.00 | 17,906.00 | 393,932.00 |
| 30 | බී. මනතුංග | 3/6/1996 | 22 | 58,829.00 | 29,414.50 | 647,119.00 |
| 31 | ඩී.එම්.ඒ. චන්දිමා | 15/07/1996 | 22 | 38,548.00 | 19,274.00 | 424,028.00 |
| 32 | එම්.ඒ.ආර්.යූ. ගුණරත්න | 16/07/1998 | 20 | 37,972.00 | 18,986.00 | 379,720.00 |
| 33 | සිසිල් විජේතුංග | 1/9/1998 | 20 | 35,283.00 | 17,641.50 | 352,830.00 |
| 34 | ඩබ්.එම්.පියරත්න | 4/1/1999 | 19 | 51,052.00 | 25,526.00 | 484,994.00 |
| 35 | ආර්.එම්.විජිතා බණ්ඩාර | 1/6/1999 | 19 | 51,052.00 | 25,526.00 | 484,994.00 |
| 36 | එස්.එස්.වීරසූරිය | 1/2/2000 | 18 | 37,396.00 | 18,698.00 | 336,564.00 |
| 37 | එච්.ටී. දිනේෂ් සිල්වා | 1/2/2000 | 18 | 37,396.00 | 18,698.00 | 336,564.00 |
| 38 | සී.කේ.කලංසූරිය | 1/2/2000 | 18 | 37,684.00 | 18,842.00 | 339,156.00 |
| 39 | පී.බී.පියවතී | 1/2/2000 | 17 | 35,352.00 | 17,676.00 | 300,492.00 |
| 40 | එන්.ඩී.එච්.මොහොට්ටි | 1/2/2000 | 18 | 33,949.00 | 16,974.50 | 305,541.00 |
| 41 | කේ.ආර්. කුමාර | 1/2/2000 | 18 | 34,846.00 | 17,423.00 | 313,614.00 |
| 42 | ප්‍රශාන්ත කීර්තිචන්ද්‍ර | 13/12/2000 | 18 | 51,052.00 | 25,526.00 | 459,468.00 |
| 43 | පී.සී.ජේ. ද සිල්වා | 15/08/2005 | 13 | 44,182.00 | 22,091.00 | 287,183.00 |
| 44 | ජී.සී.එන්.පෙරේරා | 15/08/2005 | 13 | 42,868.00 | 21,434.00 | 278,642.00 |
| 45 | වී.ජී.බී.ඩී. වීරනායක | 15/08/2005 | 13 | 42,430.00 | 21,215.00 | 275,795.00 |
| 46 | එස්.ඩබ්. විජිතානි | 25/10/2005 | 13 | 39,874.00 | 19,937.00 | 259,181.00 |
| 47 | බී.ආර්. රණවීර | 15/02/2006 | 12 | 54,353.00 | 27,176.50 | 326,118.00 |
| 48 | ආර්.එම්.ගාමිණී රත්නායක | 12/12/2007 | 11 | 33,650.00 | 16,825.00 | 185,075.00 |
| 49 | ජේ. අනිල් විජේසූරිය | 01/01//2008 | 11 | 33,650.00 | 16,825.00 | 185,075.00 |
| 50 | අයි.ඒ.ක්ලීටස් අසංග | 15/02/2008 | 10 | 35,352.00 | 17,676.00 | 176,760.00 |
| 51 | ටී.සී. විජේරත්න | 3/3/2008 | 10 | 41,140.00 | 20,570.00 | 205,700.00 |
| 52 | එම්.ඒ.ඩී.පී. කිත්සිරි | 15/07/2008 | 10 | 34,851.00 | 17,425.50 | 174,255.00 |
| 53 | එම්.ටී.ආර්. ප්‍රනාන්දු | 1/9/2008 | 10 | 33,650.00 | 16,825.00 | 168,250.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 54 | එන්.ජී.තේ.ඉන්දිකා | 6/8/2009 | 9 | 51,052.00 | 25,526.00 | 229,734.00 |
| 55 | ඩබ්.ඩී.එල්. ශ්‍රී සුගත් රත්නායක | 11/4/2009 | 9 | 34,184.00 | 17,092.00 | 153,828.00 |
| 56 | එම්.ඒ.එස්.එස්.කේ. චන්ද්‍රසිරි | 16/02/2012 | 6 | 87,429.00 | 43,714.50 | 262,287.00 |
| 57 | එච්.එම්.එස්.ඩී.හේරත් | 3/6/2013/ | 5 | 39,988.00 | 19,994.00 | 99,970.00 |
| 58 | එම්.එල්.යූ. එදිරිසිංහ | 1/7/2013 | 5 | 39,604.00 | 19,802.00 | 99,010.00 |
| 59 | පී.එල්. ගමගේ | 3/6/201 | 5 | 39,988.00 | 19,994.00 | 99,970.00 |
| 60 | එස්.ඒ.එස්.සී. පෙරේරා | 1/7/2013 | 5 | 39,604.00 | 19,802.00 | 99,010.00 |
| 61 | ඒ.එම්.ටී.අයි. අධිකාරි | 1/7/2013 | 5 | 39,604.00 | 19,802.00 | 99,010.00 |
| 62 | ආර්.එම්.සරත් රණසිංහ | 25/07/2013 | 5 | 34,685.00 | 17,342.50 | 86,712.50 |
| 63 | ඩබ්.කේ. ඉසුරු ඉන්දික | 1/7/2013 | 5 | 34,685.00 | 17,342.50 | 86,712.50 |
| 64 | ඩබ්.ජී.ඩී. අනුරාධ | 15/07/2013 | 5 | 34,685.00 | 17,342.50 | 86,712.50 |
| 65 | චම්පිකා ගුණසේකර | 25/07/2013 | 5 | 34,851.00 | 17,425.50 | 87,127.50 |
| 66 | ආර්.එම්.අමිත් කුමාර | 25/07/2013 | 5 | 32,822.00 | 16,411.00 | 82,055.00 |
| | - | | | | | 27,326,889.00 |
| | අඩු කළා<br>පාරිතෝශික ගෙවීම් | | | | | |
| 1 | පී.බී. පියවති | 1/2/2000 | 17 | 35,352.00 | 17,676.00 | 300,492.00 |
| 2 | අයි.ආර්.පියතිලක | 17/06/1987 | 30 | 39,448.00 | 19,724.00 | 591,720.00 |
| 3 | ටී.එන්. කරුණාරත්න | 21/11/1986 | 31 | 39,244.00 | 19,622.00 | 608,282.00 |
| 4 | ආර්.ඒ.පී. උදයංගනී | 20/02/1990 | 28 | 41,716.00 | 20,858.00 | 584,024.00 |
| 5 | ටී.සී. විජේරත්න | 3/3/2008 | 10 | 41,140.00 | 20,570.00 | 205,700.00 |
| | | | | | | 2,290,218.00 |
| | මුලු පාරිතෝශිකය | | | | | 25,036,671.00 |

## සටහන 11 - ක්‍රමක්ෂය

| | | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|---|
| විලම්භිත ආදායම් | | | |
| ප්‍රාග්ධන ප්‍රධාන | | | |
| පෙර වර්ෂය | | 33,180,290.03 | 36,391,721.17 |
| පවත්නා වර්ෂය | | 46,312,000.00 | 16,894,000.00 |
| | | 79,492,290.03 | 53,285,721.17 |
| අඩු කළා | | | |
| මුලු සංවර්ධන ක්‍රියාකාරකම් වියදම | **11.2** | (12,062,543.19) | (11,720,000.00) |
| | | 67,429,746.84 | 41,565,721.17 |
| අඩු කළා | | | |
| ක්‍රමක්ෂය | **11.1** | (7,337,317.89) | (8,385,431.14) |
| | | 60,092,428.95 | 33,180,290.03 |

භාණ්ඩාගාරය විසින් ලබා දෙන ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ පත්‍රයේ විලම්බිත ආදායමක් ලෙස අනාවරණය වී ඇති අතර එය 2018 වර්ෂයේ ක්ෂයවීම් අනුපාත මත පදනම් වූ ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ.

## සටහන 11.1 ක්‍රමක්ෂය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ගොඩනැගිලි | 458,120.29 | 647,580.22 |
| යන්ත්‍රෝපකරණ | 450,745.75 | 472,118.66 |
| කාර්යාල උපකරණ | 354,082.92 | 364,038.43 |
| ලී බඩු සහ සවි කිරීම් | 432,255.72 | 464,714.16 |
| මෙවලම් | 82,593.78 | 59,746.02 |
| පුස්තකාල පොත් | 116,457.23 | 109,563.79 |
| පරිඝණක | 1,346,605.75 | 1,147,099.29 |
| වාහන | 4,096,456.45 | 5,120,570.57 |
| | 7,337,317.89 | 8,385,431.14 |

## සටහන 11.2 සමස්ත සංවර්ධන ක්‍රියාකාරකම් වියදම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| දැනුවත්භාවය / පුහුණුව / TOT වැඩසටහන් | 2,204,107.80 | 1,827,926.35 |
| සේවක පුහුණුව | 452,640.60 | 238,135.00 |
| නිෂ්පාදන සංවර්ධනය | 222,531.07 | 1,044,943.54 |
| නව නිර්මාණ ප්‍රදර්ශනය | 5,586,452.99 | 5,812,141.94 |
| වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් ප්‍රදර්ශන කිරීම | 785,468.23 | 990,822.40 |
| අන්තර් ජාතික වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම | 956,776.35 | 1,180,110.71 |
| ඇගයීමේ ව්‍යාපෘති හා ක්‍රමලේඛන අධීක්ෂණය | 96,970.19 | 65,215.09 |
| අමුද්‍රව්‍ය සැකසීම සඳහා පර්යේෂණ වැඩසටහන් | 367,931.01 | 34,510.00 |
| පරීක්ෂණ අලෙවිකරණ සහ වෙළඳපල සමීක්ෂණ | 120,545.00 | 119,490.03 |
| 2106 වෙබ් නිර්මාණය | 395,350.00 | - |
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම් | 873,769.95 | 406,704.94 |
| | 12,062,543.19 | 11,720,000.00 |

## සටහන 12 - සමුච්චිත ලාභය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ඉ/ගෙ සමුච්චිත ලාභය | 24,774,638.23 | 17,103,243.15 |
| (+) පෙර වර්ෂ ගැලපුම | - | - |
| (-) පෙර වර්ෂ ගැලපුම | - | - |
| | 24,774,638.23 | 17,103,243.15 |
| වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | (7,002,070.52) | 7,671,395.08 |
| ප/ගෙ සමුච්චිත ලාභය | 17,772,567.71 | 24,774,638.23 |

## සටහන 13 - භාණ්ඩාගාර ප්‍රදාන පුනරාවර්තනය

| | 2018.12.31<br>රු. | 2017-12-31<br>රු. |
|---|---|---|
| ජනවාරි | 4,374,750.00 | 4,485,000.00 |
| පෙබරවාරි | 5,273,250.00 | 4,285,000.00 |
| මාර්තු | 4,787,000.00 | 4,916,666.00 |
| අප්‍රේල් | 4,864,000.00 | 4,780,000.00 |
| මැයි | 4,416,437.00 | 4,310,000.00 |
| ජුනි | 6,514,917.00 | 4,916,000.00 |
| ජූලි | 4,166,000.00 | 4,679,583.00 |
| අගෝස්තු | 5,749,834.00 | 4,916,666.00 |
| සැප්තැම්බර් | 6,106,917.00 | 4,916,666.00 |
| ඔක්තෝබර් | 5,239,000.00 | 5,277,583.00 |
| නොවැම්බර් | 4,281,000.00 | 5,435,000.00 |
| දෙසැම්බර් | 5,256,083.00 | 5,105,168.00 |
| | 61,029,188.00 | 58,023,332.00 |

## භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධනය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| වත්කම් සඳහා භාණ්ඩාගාර ප්‍රදානය | 34,249,456.81 | 5,174,000.00 |
| සංවර්ධන කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රදානය | 12,062,543.19 | 11,720,000.00 |
| | 46,312,000.00 | 16,894,000.00 |

## සටහන 14 - වෙනත් ආදායම්

| | සටහන | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|---|
| පුද්ගලික වාහන භාවිතය සඳහා බද්ද | | 6,000.00 | 6,600.00 |
| රක්ෂණ වන්දි සඳහා ලද මුදල් | | (2,409.25) | |
| විවිධ | | 143,211.86 | 153,250.75 |
| ලාභ හා අලාභ (උප සටහන 01) | 14.1 | (232,983.59) | |

| | | | |
|---|---|---|---|
| | | | 524,565.13 |
| රජයේ දායකත්වය | | 27,297.00 | 8,700.00 |
| විකුණුම් | | 95,153.50 | - |
| **මෝස්තර අධ්‍යාපන ගිණුම** | | | |
| NDID 2017-2018 පාඨමාලා ගාස්තු | | 1,578,000.00 | 2,507,500.00 |
| HND 2018-2020 පාඨමාලා ගාස්තු | | 502,500.00 | - |
| අයදුම්පත් ගාස්තු | | - | 54,000.00 |
| සහතික ප්‍රදානෝත්සවය ගාස්තු | | - | 244,800.00 |
| **මෝස්තර උපදේශන ආදායම** | | | |
| මෝස්තර උපදේශන ආදායම | | (447,900.00) | 555,000.00 |
| ලක්සල ව්‍යාපෘතිය | 14.2 | 88,250.00 | 75,865.00 |
| යූඑන්ඩීපී ආදායම | | 2,718,665.95 | 13,550,957.04 |
| OXFAM ආදායම | | - | 2,622,000.00 |
| වෙනත් විකුණුම් | 14.3 | 278,300.00 | 129,820.00 |
| පුහුණු වැඩසටහන පිළිබඳ උපදේශන ආදායම | | | |
| තොග ආදායම | | 9,460.00 | 21,200.00 |
| **කාර්ය මණ්ඩල ණය ගිණුම් ආදායම** | | | |
| පොලී ආදායම | | 401,919.69 | 330,338.60 |
| | | 5,165,465.16 | 20,784,596.52 |

**උප සටහන 14.1- ජාතික මෝස්තර මධ්‍යස්ථානය**
**<u>2018.31.12 අවසන් වන වර්ෂය සඳහා ලාභ හා අලාභ ගිණුමේ ප්‍රකාශය.</u>**

| | සටහන | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|---|
| ආදායම (විකුණුම්) | | 2,104,127.35 | 1,256,235.50 |
| විකුණුම් පිරිවැය (සටහන 1.1) | 14.1.1 | 2,182,615.94 | 652,731.40 |
| දළ ලාභය | | (78,488.59) | 603,504.10 |
| අඩු- භාවිතා කළ නොහැකි නිමි භාණ්ඩ | | (159,159.00) | (92,939.97) |
| පොදු පහසුකම් මධ්‍යස්ථාන ආදායම | | 4,664.00 | 14,001.00 |
| මුළු ලාභය | | (232,983.59) | 524,565.13 |

## සටහන 14- 1-1 - විකුණුම් පිරිවැය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| <u>අමුද්‍රව්‍ය</u> | | |
| ආරම්භක තොගය (2018 ජනවාරි 1) | 785,919.88 | 526,238.36 |
| මිලදී ගැනීම් | 873,769.95 | 406,704.94 |
| | 1,659,689.83 | 932,943.30 |
| <u>අඩු කළා</u> - | | |
| අවසන් තොගය 2018 දෙසැම්බර් 31 | (635,761.31) | (785,919.88) |
| ද්‍රව්‍ය පරිභෝජනය | 1,023,928.52 | 147,023.42 |
| <u>නිමි භාණ්ඩ</u> - | | |
| ආරම්භක තොගය 2018 ජනවාරි 1 | 5,399,000.51 | 4,348,606.08 |
| ද්‍රව්‍ය පරිභෝජනය | 6,422,929.03 | 4,495,629.50 |
| මිලදී ගැනීම් | 652,415.00 | 1,649,042.38 |
| | 7,075,344.03 | 6,144,671.88 |
| <u>අඩු</u> - | | |
| ඉතිරි තොගය 31 දෙසැම්බර් 2018 | 4,892,728.09 | 5,491,940.48 |
| විකුණුම් පිරිවැය | 2,182,615.94 | 652,731.40 |

## උප සටහන 14.2 - ලක්සල ව්‍යාපෘතිය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ලක්සල විකුණුම් ආදායම | 439,920.00 | 409,711.00 |
| ලක්සල විකුණුම් වියදම් | (351,670.00) | (333,846.00) |
| | 88,250.00 | 75,865.00 |

## උප සටහන 14.3 - වෙනත් විකුණුම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ලක්පහන | 129,100.00 | |
| හෝම් ඇන්ඩ් යූ | 11,400.00 | |
| ලක් ආකේඩ් | 28,000.00 | |
| ගන්දර | 109,800.00 | |
| | 278,300.00 | |

## සටහන 15 - පුද්ගලික පඩිනඩි

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| වැටුප් සහ වේතන | 41,982,690.14 | 40,683,407.72 |
| සේ.අ.අ. | 4,994,437.23 | 4,763,255.96 |
| සේ.නි.භා.අ. | 1,248,560.79 | 1,197,901.43 |
| අතිකාල | 1,048,283.02 | 899,210.06 |
| වෙනත් දීමනා | 93,000.00 | 261,890.58 |
| සභාපතිගේ දීමනාව | 1,168,260.00 | |
| අධ්‍යක්ෂ ප්‍රවාහන දීමනාව | 600,000.00 | |
| | 51,135,231.18 | 47,805,665.75 |

## සටහන 16 - ගමන් වියදම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| දේශීය | 248,483.37 | 247,891.25 |
| විදේශීය | - | 506,060.81 |
| | 248,483.37 | 753,952.06 |

## සටහන 17 - සැපයුම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 487,443.17 | 392,905.93 |
| ඉන්ධන වියදම් | 484,837.29 | 472,567.93 |
| නිල ඇඳුම් | 88,000.00 | 84,000.00 |
| වෛද්‍ය | 4,883.00 | 1,972.00 |
| වෙනත් සැපයුම් | 12,269.00 | 11,324.75 |
| | 1,077,432.46 | 962,770.61 |

## සටහන 18 - සැපයුම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| වාහන නඩත්තු කිරීම | 1,393,060.33 | 1,220,932.13 |
| ගොඩනැගිලි නඩත්තුව | 552,703.50 | 504,385.00 |
| යන්ත්‍රෝපකරණ | 30,244.00 | 83,283.00 |
| කාර්යාල උපකරණ | 438,586.40 | 173,031.44 |
| | 2,414,594.23 | 1,981,631.57 |

## සටහන 19 - කොන්ත්‍රාත් සේවා

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ප්‍රවාහන හා කුලී ගාස්තු | 4,119.00 | 628,814.28 |
| දුරකථන ගාස්තු | 969,098.50 | 830,626.18 |
| තැපැල් | 32,212.00 | 31,539.00 |
| විදුලිය සහ ජලය | 1,097,998.09 | 966,821.48 |
| ගාස්තු සහ බදු | 84,185.84 | 99,633.14 |

| | | |
|---|---|---|
| විගණන ගාස්තු | 1,744,770.00 | 279,585.00 |
| නීති ගාස්තු | 20,000.00 | - |
| පළිබෝධ පාලන සේවා | 43,000.00 | 32,000.00 |
| දැන්වීම | 282,313.25 | 384,560.00 |
| සුලු මුදල් සහ විවිධ | 182,635.46 | 141,008.18 |
| බැංකු ගාස්තු | 14,515.00 | 15,887.00 |
| සනීපාරක්ෂක හා පිරිසිදු කිරීම | 153,566.24 | 154,685.00 |
| පුවත්පත | 57,000.00 | 75,525.00 |
| කොන්ත්‍රාත් සේවා (සේවා ගිවිසුම) | 112,240.75 | 125,573.96 |
| රක්ෂණය | 466,228.81 | 618,983.37 |
| වාහන බලපත්‍රය | 73,175.00 | 80,306.93 |
| සේවාදායකයින් සමඟ රැස්වීම් | 375,572.85 | 362,039.60 |
| වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම | 555,667.50 | 65,822.50 |
| ඉන්ධන දීමනා | 236,700.00 | 449,280.00 |
| මුද්දර ගාස්තු | 1,325.00 | - |
| මණ්ඩල ලේකම් ගාස්තු | 18,000.00 | 18,000.00 |
| මණ්ඩල සාමාජික ගාස්තු | 258,000.00 | 230,000.00 |
| විගණන හා කළමනාකරණ කමිටු සාමාජික ගාස්තුව | 156,000.00 | 150,000.00 |
| සම්මුඛ පරීක්ෂණ වියදම් | 9,470.00 | 134,254.75 |
| ආරක්ෂක ගාස්තු | 329,353.40 | 188,442.45 |
| වෙබ් සත්කාරක ගාස්තු | - | 17,000.00 |
| මැනුම් වියදම් මණ්ඩලය | 298,559.94 | 257,368.27 |
| | 7,575,706.63 | 6,337,756.09 |

## සටහන 20 - ක්ෂයවීම

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ගොඩනැගිල්ල | 458,120.29 | 647,580.22 |
| යන්ත්‍රෝපකරණ | 450,745.75 | 472,118.66 |
| කාර්යාල උපකරණ | 354,082.92 | 364,038.43 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 432,255.72 | 464,714.16 |
| මෙවලම් | 82,593.78 | 59,746.02 |
| පුස්තකාල පොත් | 116,457.23 | 109,563.79 |
| පරිගණක | 1,346,605.75 | 1,147,099.29 |
| වාහන | 4,096,456.45 | 5,120,570.57 |
| | 7,337,317.89 | 8,385,431.14 |

## සටහන 21 - සංවර්ධන ක්‍රියාකාරකම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| දැනුවත්භාවය / පුහුණුව / TOT වැඩසටහන් | 2,204,107.80 | 1,827,926.35 |
| සේවක පුහුණුව | 452,640.60 | 238,135.00 |
| නිෂ්පාදන සංවර්ධනය | 222,531.07 | - |
| නව නිර්මාණ ප්‍රදර්ශනය | 5,586,452.99 | 5,812,141.94 |
| වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් ප්‍රදර්ශනය | 785,468.23 | 990,822.40 |
| අන්තර් ජාතික වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වීම | 956,776.35 | 1,180,110.71 |
| ඇගයීමේ ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය | 96,970.19 | 65,215.09 |
| අමුද්‍රව්‍ය සැකසීම සඳහා පර්යේෂණ වැඩසටහන් | 367,931.01 | 34,510.00 |
| පරීක්ෂණ අලෙවිකරණ සහ වෙළඳපල සමීක්ෂණ | 120,545.00 | 119,490.03 |
| 2106 වෙබ් නිර්මාණය | 395,350.00 | - |
| | 11,188,773.24 | 10,268,351.52 |

## සටහන 22 - ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සහ ලිවින් හුඩ් සංවර්ධන වැඩසටහන

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| දිවියාකා උද්‍යානය- පඩුවස්නුවර | 132,385.28 | |
| ජීවනෝපාය සංවර්ධන වැඩසටහන | | |
| - කැගල්ල අඹේපුස්ස | 1,325,490.00 | |
| - මෙවලම් හා උපකරණ බෙදා හැරීම | 12,056,576.00 | |
| - කැගල්ල බෙල්ලපාන | 311,328.79 | |
| - අනුරාධපුර ලුනාව | 204,431.00 | |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන | | |
| -මොණරාගල මැදගම | 259,255.74 | |
| - මාතර කිරින්ද | 281,451.90 | |
| .-ගම්මාන වැඩසටහන | 58,882.91 | |
| .-අම්පාර | 230,899.00 | |
| .-කැළණිය වරාගොඩ | 168,906.00 | |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන | | |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන -යක්කලවිල | | 374,264.07 |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන -ගාල්ල | | 709,609.30 |

| | | |
|---|---|---|
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - නුගවෙල | | 390,844.25 |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - මන්නාරම | | 542,233.00 |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන -කෑගල්ල | | 561,166.13 |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - කිරිමැටියාන | | 416,355.90 |
| ව්‍යවසාය සංවර්ධන වැඩසටහන - ආලෝකගම | | 125,326.00 |
| **ලිවින් හුඩ් සංවර්ධන වැඩසටහන** | | |
| ලිවින් හුඩ් සංවර්ධන වැඩසටහන - කෑගල්ල | | 2,410,176.24 |
| ලිවින් හුඩ් සංවර්ධන වැඩසටහන - මන්නාරම | | 3,384,886.77 |
| ලිවින් හුඩ් සංවර්ධන වැඩසටහන -වව්නියාව | | 2,414,976.78 |
| | | 1,354,275.06 |
| | 15,029,606.62 | 12,684,113.50 |

## සටහන 23 - වෙනත් වියදම්

| | සටහන | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|---|
| **මෝස්තර අධ්‍යාපන ගිණුම** | | | |
| අධ්‍යාපන ක්‍රියාකාරකම් | 23.1 | 1,184,873.23 | 1,129,294.96 |
| ගොඩනැගිලි කුලිය | | 1,020,268.81 | 73,666.67 |
| වෙනත් | | 77,711.19 | 164,751.33 |
| විදුලිබලය | | 40,517.60 | |
| දුරකථන | | 4,948.66 | |
| මුද්දර ගාස්තු | | 125.00 | |
| බොල් ණය | | 200,000.00 | |
| ක්ෂයවීම | | 106,568.19 | |
| **මෝස්තර උපදේශන ගිණුම** | | | |
| UNDP ව්‍යාපෘතිය | 23.2 | 2,718,665.95 | 8,560,074.54 |
| OXFAM ව්‍යාපෘතිය | | - | 1,274,402.90 |
| වෙනත් විකුණුම් වියදම් | 23.3 | 259,999.00 | 105,310.00 |
| වෙනත් පුහුණු වියදම් | | - | |
| විදේශ සංචාර | | | 535,021.00 |
| වෙනත් වියදම් | | 35,894.84 | 26,301.94 |
| කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩසටහන | | | 872,558.60 |
| කාර්ය මණ්ඩල දිරි දීමනා දීමනාව | | 1,260,000.00 | |
| මුද්දර ගාස්තු | | 50.00 | |

| | | | |
|---|---|---|---|
| බොල් ණය | | 29,000.00 | |
| යල්පැනගිය තොගය | | 18,905.00 | |
| ක්ෂය වීම | | 54,015.34 | 57,874.41 |
| | | 7,011,542.81 | 12,799,256.35 |

## සටහන 23.1 - අධ්‍යාපන ක්‍රියාකාරකම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| NDID 2016 පාඨමාලා වියදම් | | 164,340.00 |
| NDID 2017-2018 පාඨමාලා වියදම් | 1,039,692.03 | 361,637.90 |
| සහතික ප්‍රදානය කිරීමේ උත්සවය | | 603,317.06 |
| HND 2018-2020 පාඨමාලා වියදම් | 145,181.20 | |
| | 1,184,873.23 | 1,129,294.96 |

## සටහන 23.2 - UNDP ව්‍යාපෘතිය

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| මඩකළපුව | | 37,842.62 |
| පුත්තලම | | 1,106,846.01 |
| මොණරාගල | | 618,711.50 |
| දිගාමඩුල්ල | | 262,433.13 |
| උපකරණ | | 3,943,490.00 |
| BMICH | | 207,621.32 |
| මන්නාරම | | 134,891.00 |
| අනුරාධපුර | | 443,532.00 |
| ලේබම් | | 189,999.98 |
| වාහන නඩත්තුව | | 132,114.30 |
| කාර්ය මණ්ඩල දීමනාව | | 1,185,000.00 |
| පසුගිය වසරේ අත්තිකාරම් පියවීම | | 184,165.00 |
| අධීක්ෂණය | | 62,580.00 |
| Ot/Bata | | 50,847.68 |

| | | |
|---|---|---|
| UNDP තල් පුහුණු වැඩසටහන- වවුනියා | 275,804.87 | |
| UNDP උපකරණ සැපයුම -වවුනියා | 442,600.00 | |
| UNDP උපකරණ සැපයීම -අනුරාධපුර | 38,142.60 | |
| UNDP උපකරණ සැපයීම -මන්නාරම | 184,120.00 | |
| UNDP උපකරණ සැපයීම - පුත්තලම | 938,902.46 | |
| UNDP ප්‍රගති අධීක්ෂණය | 830,746.02 | |
| UNDP වෙළඳපල සම්බන්ධතා සහ වෙළඳ ප්‍රදර්ශන | 8,350.00 | |
| | 2,718,665.95 | 8,560,074.54 |

## සටහන 23.3 - වෙනත් විකුණුම් වියදම්

| | 2018.12.31<br>රු. | 2017.12.31<br>රු. |
|---|---|---|
| ලක්පහන | 133,320.00 | |
| හෝම් ඇන්ඩ් යූ | 4,050.00 | |
| ලක් ආර්කේඩ් | 24,050.00 | |
| ගන්දර | 98,579.00 | |
| | 259,999.00 | |

# විගණකාධිපති
# වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඒ/එන්ඩීසී/65/2018/එෆ්ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති

ජාතික මෝස්තර මධ්‍යස්ථානය

**ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.15,734,958 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සඳහා සහ එදිනට එකතු වටිනාකම රු.5,040,775 ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයන් සඳහා ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ආ) මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ගිණුම් 08 ක එකතු වටිනාකම රු.94,355,913 ක් වුවද, වත්කම් උපලේඛන අනුව එම වත්කම් ගිණුම් වල එකතු වටිනාකම රු.76,116,899 ක් වූයෙන් රු.18,239,014 ක නොසැසඳුණු ශේෂයක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය

සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මධ්‍යස්ථානයේ පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 128 (1) (ආ) | ගෙවීම් කිරීමට පෙර අදාළ ලියවිලි පරීක්ෂා කර, නිර්දේශ කර අනුමත කර ගෙවීම් කළ යුතු වුවත්, එකතුව රු.17,047,940 ක ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන දෙවන බිල්පත්‍රයට ගෙවීම් කිරීමට ප්‍රථම ප්‍රමාණ බිල් පත්‍රය, මුළු සාරාංශ පත්‍රය සහ ප්‍රධාන සාරාංශ පත්‍ර එසේ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12 යොමුවේ 5 වන වගන්තිය | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව වැට් බදු ගෙවීමේදී එකතුව රු.3,256,772 ක වැට් බදු ගෙවීම් පිළිබඳව විගණකාධිපතිවරයාට පිටපතක්ද සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම්දීමට පියවර ගෙන නොතිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මධ්‍යස්ථානයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ iv වන කොටස 82 (අ) වගන්තිය | ශිල්පීන්ගේ දැනුම වර්ධනය සඳහා විරල අමුද්‍රව්‍ය ආදේශනය සම්බන්ධයෙන් පර්යේෂණ හා නව නිෂ්පාදන ක්‍රියාවලීන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,160,000 ක ප්‍රතිපාදන වෙන් කර පර්යේෂණ 03 ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද, රු.536,000 ක් වැය කර රතු මැටි ආශ්‍රිත භාණ්ඩ වර්ණ ගැන්වීමේ කටයුතු පමණක් ඉටු කර තිබූ අතර, අනෙක් පර්යේෂණ 02 අවසන් කර නොතිබුණි. |
| (ආ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ iv වන කොටස 82 (ආ) වගන්තිය | හස්ත කර්මාන්ත නිෂ්පාදන ප්‍රචලිත කිරීම සහ හස්ත කර්මාන්ත නිපැයුම් සඳහා දේශීය හා විදේශීය වෙළඳපල සංවර්ධනය යටතේ රු.10,400,000 ක ප්‍රතිපාදන වැයකර සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරකම් 07 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණි. එම ක්‍රියාකාරකම් අතරින් ක්‍රියාකාරකම් 05 සාර්ථකව ඉටු කර තිබූ අතර, ඉතිරි ක්‍රියාකාරකම් 02 ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන වැය කර තිබුණද, එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණන අංශය වෙත ලිඛිතව ඉදිරිපත් නොකිරීම නිසා එම ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය පරීක්ෂා කිරීමට නොහැකි විය. |
| (ඇ) 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා අනුබද්ධ ආයතන පනතේ iv වන කොටස 82 (ඊ) වගන්තිය | අමුද්‍රව්‍ය සඳහා ප්‍රමිත සහතික නිකුත් කිරීමේ ක්‍රියාකාරකම 2018 දෙසැම්බර් 31 දින තෙක්ම ක්‍රියාවට නැංවීමට මධ්‍යස්ථානය අපොහොසත් වී තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඵ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට ඉල්ලීම් කිරීමට පෙර අස්තිත්වය විසින් ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කළ යුතු වුවත්, එසේ ඉඩම් අත්කර ගැනීමකින් තොරව මධ්‍යස්ථානය විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.30,913,819 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 වගන්තිය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීම අවසන් වී සති 05 ක් ඇතුළත ප්‍රතිග්‍රහන ලිපිය (Letter of Acceptance) නිකුත් කළ යුතු වුවත්, මධ්‍යස්ථානය උක්ත කාර්ය සඳහා එම ලිපිය නිකුත් කිරීමට මාස 03 ක කාලයක් ගතකර තිබුණි.

(ඇ) උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) වගන්තිය ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, මධ්‍යස්ථානය පෞද්ගලික ආයතනයකින් ජීවන තත්ත්වය නගා සිටුවීමේ වැඩසටහන සඳහා එකතුව රු.12,056,576 ක් ගෙවා මහන මැෂින් 304 ක් මිලදී ගැනීමේදී ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබූ අතර, එම මහන මැෂින් ගබඩා ලේඛනගත කිරීමකින්ද තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2018 අප්‍රේල් සහ ජූනි මාස වලදී භාරදී තිබුණි.

(ඇ) උක්ත දෙවන බිල්පත්‍රයට ගෙවීම් කිරීමේදී එකතුව රු.506,417 ක මිල විචලන වටිනාකමකට අදාළ මිල විචලන ලේඛනය උපදේශක ආයතන නිලධාරීන් විසින් පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම සහ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඉ) ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනය හා කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ නව නිර්මාණ සහ හැකියා වර්ධන පුහුණු වැඩසටහන් සඳහා රු.2,700,000 ක ප්‍රතිපාදන භාවිතා කර ශිල්පීන් 477 දෙනෙකුට පුහුණුව ලබා දීමට සැලසුම් කර තිබුණද, එකතුව රු.1,500,000 ක් වැය කර ශිල්පීන් 256 දෙනෙකු වෙත පුහුණුව ලබා දීම නිසා මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 54 ක් විය.

(ඊ) ව්‍යාපෘති වියදම් නිවැරදිව පූර්ව සැලසුම් නොකිරීම හේතුවෙන් විදේශාධාර ව්‍යාපෘති 02 ක් වන Oxfam සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP) වෙනුවෙන් ලැබී තිබූ අරමුදල් වලින් රු.17,508,753 ක සිට රු.11,835,233 ක් දක්වා පරාසයක වූ අරමුදල් සමාලෝචිත වර්ෂය මුළුල්ලේ බැංකු ජංගම ගිණුමක කිසිඳු ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

(උ) 2018 වර්ෂයේ මධ්‍යස්ථානය විසින් යුගයට නිමවුම් ප්‍රදර්ශනය සඳහා කැටලොග් 2,500 ක් එකතුව රු.235,000 ක් ගෙවා මුද්‍රණය කිරීමේදී එම කැටලොග් ප්‍රදර්ශනය අවසන් වීමට පෙර මුද්‍රණය කර භාර ගෙන ඒවා ශිල්පීන්, ආරාධිත අමුත්තන් සහ මහජනතාව අතර බෙදා හැරීමට කටයුතු නොකිරීම නිසා මෙම වියදම ආර්ථික නොවන වියදමක් බව නිරීක්ෂණය විය.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) අභ්‍යන්තර විගණන අංශය සඳහා 2017 නොවැම්බර් මස නිලධාරියෙකු බඳවාගෙන තිබූ අතර, 2018 දෙසැම්බර් 07 දින එම නිලධාරියා සේවයෙන් ඉල්ලා අස්වී තිබුණි. එම අංශය සඳහා කාර්ය මණ්ඩලය අනුයුක්ත කර නොතිබූ අතර, අභ්‍යන්තර විගණක තනතුරට ස්ථිරව බඳවා ගන්නා තෙක් ආයතනයේ ගිණුම් නිලධාරී වැඩ බැලීමට 2019 ජනවාරි 21 දින සිට පත්කර තිබුණි. මෙම හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළ සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන කාර්යයක් ඉටු කර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nation Development Program) ක්‍රියාත්මක කිරීමේදී මෙම වැඩසටහන සඳහා ලැබූ මුදල් ජංගම ගිණුමකට බැර කර තිබුණි. මෙම ජංගම ගිණුමේ ඉතිරි වූ මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එකතු වටිනාකම රු.5,731,750 ක් ආයතනයේ සේවකයින්ට දිරි දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති